# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 නොවැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන
# කෘෂිකාර්මික ඉඩම් පනත

[සහතිකය සටහන් කළේ 1973 ඔක්තෝබර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 18/73.

කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවීන්ගේ අඳය සුරක්ෂිත කරවීම පිණිසත්; අඳ ගොවීන් විසින් ඉඩම් හිමියන්ට ගෙවිය යුතු බද්ද නියම කිරීම පිණිසත්; ගොවි කාරක සභා පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම පිණිසත්; ඒ කාරක සභාවල බලතල හා යුතුකම් නියම කිරීම පිණිසත්; කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් අඳ හා වෙනත් ආරාවුල් කෘෂිකර්ම විනිශ්චය අධිකාර මගින් විසඳීමට විධිවිධාන සැලැස්වීම පිණිසත්; 1958 අංක 1 දරන කුඹුරු පනත ඉවත් කිරීමට විධිවිධාන සැලැස්වීම සහ ඒ හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මෙම පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

## I වන කොටස

### කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවියෝ

*කුඹුරක් බදු ගත් තැනැත්තකු එහි අඳ ගොවියා ලෙස සැලකිය යුතු අවස්ථා.*

2. (1) යම් කුඹුරු ප්‍රමාණයක් සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයෙහි මේ පනත වලංගුවීමට පෙර හෝ පසු ව යම් වාචික හෝ ලිඛිත ගිවිසුමක් යටතේ එය බදු ගත් යම් තැනැත්තෙක් ඒ කුඹුරු ප්‍රමාණයෙහි ගොවියා වී සිටී ද ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වේ නම් මේ පනතෙහි විධිවිධානවලට යටත් ව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙහි අඳ ගොවියා විය යුතුය.

(2) යම් කුඹුරු ප්‍රමාණයක් සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයෙහි මේ පනත වලංගුවීමට පෙර හෝ පසු ව යම් වාචික හෝ ලිඛිත ගිවිසුමක් යටතේ එය බදු ගත් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් හවුලේ හෝ තට්ටු මාරුවට ඒ කුඹුරු ප්‍රමාණයෙහි ගොවියා ව සිටින විට ඒ එක් එක් තැනැත්තා ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නම්, ඒ කුඹුරු ප්‍රමාණයෙහි තමා ගොවියකු වී සිටින කන්නය හෝ කන්න සඳහා එහි අඳ ගොවියකු විය යුතුය.

1—ඒ 01047—33,410 (73/10)

අඳ ගොවියන්ගේ අයිතිවාසිකම්, කුඹුරුවලින් අස් කෙරෙන ඇතැම් අඳ ගොවියන් සම්බන්ධ විධිවිධාන හා කුඹුරුවල අඳ ගොවියන් අස් කිරීම පිළිබඳ සීමාව.

3. (1) යම් කුඹුරු ප්‍රමාණයක් ගොවිතැන් කරන අඳ ගොවියකුට මේ පනතේ විධිවිධාන අනු ව එම කුඹුරු ප්‍රමාණය බුක්තියට ගෙන වැඩ කිරීමේ අයිතිවාසිකම තිබිය යුතුය. එම කුඹුරු ප්‍රමාණය අඳ ගොවියාට බදු දී ඇති යම් වාචික හෝ ලිඛිත ගිවිසුමක කුමක් සඳහන් වුව ද ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් නොකළ යුතුය. තව ද අඳ ගොවියා ඒ කුඹුරු ප්‍රමාණය බුක්තියට ගෙන වැඩ කිරීමේ දී කිසි ම තැනැත්තකු විසින් එයට බාධා නොකළ යුතු අතර ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනත යටතේ ඉඩම් හිමියාට ගෙවීමට නියමිත බද්දට වැඩි කිසි ම බද්දක් ඉඩම් හිමියා විසින් අඳ ගොවියාගෙන් ඉල්ලීම හෝ භාර ගැනීම නොකළ යුතුය.

(2) වෙන යම් නීතියක කුමක් සඳහන් වුව ද බෙදුම් නඩු පනත යටතේ යම් තැනැත්තකු විසින් මිලට ගත්, හෝ බෙදීම සඳහා වූ තීන්දු ප්‍රකාශයක් යටතේ සමඅයිතිකරුවකුට වෙන් කර දෙන ලද, යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා, අවස්ථාවෝචිත විය හැකි පරිදි, ඒ ගැණුම්කරුගේ හෝ සමඅයිතිකරුගේ අඳ ගොවියා ලෙස සැලකිය යුතු අතර මේ පනතේ විධිවිධාන එපරිද්දෙන් ම අදාළ වන්නේය.

(3) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු විසින්, ඒ ප්‍රමාණය (මෙහි මින් මතු " විනිශ්චය අධිකාරය " යනුවෙන් සඳහන් කෙරෙන) යම් කෘෂිකර්ම විනිශ්චය අධිකාරයක බල ප්‍රදේශයක් තුළ පිහිටා ඇත්තේ ද ඒ විනිශ්චය අධිකාරය වෙත, තමන් ඒ ප්‍රමාණයෙන් අස් කරනු ලැබ ඇතැයි නිවේදනය කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා අස් කරනු ලැබී ද නොලැබී ද යන ප්‍රශ්නය නිරාකරණය කිරීමේ කාර්යය සඳහා ඒ විනිශ්චය අධිකාරය විසින් පරීක්ෂණයක් පැවැත්විය හැකිය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් නිවේදනය, එසේ අස් කළ දිනයේ සිට අවුරුද්දක් ඇතුළත කළ යුතුය.

(5) ඒ තැනැත්තා අස් කරනු ලැබ ඇති බව විනිශ්චය අධිකාරය සෑහීමට පත් වන සේ ඒ පරීක්ෂණයේ දී ඔප්පු කරනු ලැබුවහොත්, විරුද්ධ තත්ත්වයක් ඇති බව ඔප්පු කරනු ලැබූ විටක හැර, ඒ අස් කිරීම කරන ලද්දේ ඒ ප්‍රමාණයේ ඉඩම් හිමියා විසින් හෝ ඔහුගේ වුවමනාව පරිදි බව පූර්වනිගමනය කළ යුතුය.

(6) ඒ ප්‍රමාණයේ ඉඩම් හිමියාට සහ අස් කරනු ලැබූ තැනැත්තාට පෞද්ගලික ව හෝ නියෝජිතයකුගේ මාර්ගයෙන් ඒ පරීක්ෂණයේ දී කරුණු දක්වා සිටීමේ අවස්ථාවක් ලබා දිය යුතුය. ඒ ප්‍රශ්නය පිළිබඳ විනිශ්චය අධිකාරයේ තීරණය ඉඩම් හිමියා වෙත හා අස් කරනු ලැබූ තැනැත්තා වෙත ලියවිල්ලකින් නිවේදනය කළ යුතුය.

ඒ තීරණයෙන් ඉඩම් හිමියා හෝ අස් කරනු ලැබූ තැනැත්තා අතෘප්තියට පත් වූයේ නම්, තමන් වෙත ඒ නිවේදනය ලැබීමෙන් පසු තිස් දවසක් ඇතුළත ඒ තීරණයට විරුද්ධ ව ඔහු විසින් අනෙක් තැනැත්තා වගඋත්තරකරු ලෙස සඳහන් කොට ලිඛිත පෙත්සමක් මගින් නීති ප්‍රශ්නයක් මත අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය.

(7) (6) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු අතර එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

(8) (3) වන උපවගන්තියේ සඳහන් කාරණයේ දී—

(අ) අස් කිරීමක් සිදු ව ඇති බව විනිශ්චය අධිකාරය විසින් තීරණය කරන ලදු ව ඒ තීරණයට විරුද්ධ ව අභියාචනයක් කිරීමට දී ඇති කාලසීමාව ඇතුළත අභියාචනයක් කර නොමැති අවස්ථාවක, නැතහොත් විනිශ්චය අධිකාරයේ තීරණය අභියාචනයක දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක; හෝ

(ආ) අස් කිරීමක් සිදු වී නොමැති බව විනිශ්චය අධිකාරය විසින් තීරණය කරන ලදු ව විනිශ්චය අධිකාරයේ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වෙනස් කොට, අස් කිරීමක් සිදු වී ඇතැයි තීරණය කළ අවස්ථාවක—

(i) අස් කරනු ලැබූ තැනැත්තාට ඒ කුඹුරු ප්‍රමාණය බුත්තියට ගැනීමේ සහ වැඩ කිරීමේ අයිතිවාසිකම ආපසු ලබා දිය යුතුය; තව ද

(ii) විනිශ්චය අධිකාරය විසින් කෙරෙන ලිඛිත ආඥාවක නිශ්චිත ව සඳහන් දිනයක හෝ ඉන් පෙර ඒ කුඹුරු ප්‍රමාණය බුත්තියට ගෙන සිටින සෑම තැනැත්තකු ම එයින් ඉවත් විය යුතු යයි ඒ ආඥාවෙන් නියම කළ යුතුය. ඒ තැනැත්තා විසින් ආඥාව පිළිපැදීම පැහැර හැරියහොත් 4 වන වගන්තියේ විධිවිධාන අනු ව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කළ යුතු අතර මේ ඡේදය යටතේ නිකුත් කරන ලද ආඥාව කට විෂය වූ තැනැත්තකු ඒ ආඥාවේ නිශ්චිත දිනයෙන් පසු ඒ කුඹුරු ප්‍රමාණය බුත්තියට ගෙන සිටීම කර ගෙන යන එක් එක් දවස සඳහා ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා විසින් තම දැනුම,

කැමැත්ත හෝ ගුප්තානුකූලතාව යන මෙයින් තොර ව, ඒ තැනැත්තා අස් කරනු ලැබූ බව විනිශ්චය අධිකාරය සෑහීමට පත් කරනු ලැබූ විටක හැර, ඒ කුඹුරු ප්‍රමාණයේ හිමියා විසින් මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් තැනැත්තාහට, නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයක් අනු ව, අලාභ ගෙවිය යුතුය.

(9) (8) වන උපවගන්තිය යටතේ අලාභ වශයෙන් යම් තැනැත්තකුට ගෙවිය යුතු යැයි කුඹුරු ප්‍රමාණයක ඉඩම් හිමියකුට නියම කරනු ලැබූ යම් මුදලක් එය ඉල්ලා සිටි දිනයෙන් පසු දින දහහතරක් ඇතුළත ගෙවීම ඔහු විසින් පැහැර හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඒ කුඹුරු ප්‍රමාණය පිහිටි ස්ථානය පිහිටි සීමාවෙහි අධිකරණ බලය දරන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ තැනැත්තා විසින් ඉල්ලීමක් කරනු ලැබීමෙන්, ඒ මුදල එම අධිකරණය විසින් සිය සාමාන්‍ය අධිකරණ බලතල ක්‍රියාවෙහි යෙදවීමෙහි දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වැඩි වුව ද ඒ අධිකරණය විසින් නියම කරනු ලැබූ දඩයක ආකාරයෙන් අය කර ගත හැකිය.

(10) (මින් මතු මේ උපවගන්තියේ " බදු දෙන්නා " ලෙස සඳහන් කෙරෙන) යම් තැනැත්තකු (මින් මතු මේ උපවගන්තියේ " බදු ගන්නා " ලෙස සඳහන් කෙරෙන) යම් තැනැත්තකුට කිසියම් කුඹුරු ප්‍රමාණයක් බදු දුන් විට, ඒ බදු ගන්නා, එය වගා කරන්නා නොවීමේ හේතුවෙන් එහි අඳ ගොවියා නොවන කල්හි, ඔහු ඒ කුඹුරු ප්‍රමාණය (මින් මතු මේ උපවගන්තියේ "දෙවන අඳ ගොවියා " ලෙස සඳහන් කෙරෙන) අන් තැනැත්තකුට බදු දී ඒ දෙවන අඳ ගොවියා එහි වගා කරන්නා වීමේ හේතුවෙන් එහි අඳ ගොවියා බවට පත් වුවහොත් බදු දෙන්නා විසින් බදු ගන්නාට දුන් බද්ද කෙළවරවීම දෙවන අඳ ගොවියාට එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් ඇති අයිතිවාසිකම් කෙරෙහි කිසි ම අයුරකින් බල නොපෑ යුතුය.

(11) යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳ ව ඉඩම් හිමියා සතු අයිතිවාසිකම, හිමිකම හා සම්බන්ධතාව තෑගි කිරීම, අන්තිම කැමති පත්‍රයක් මගින් හෝ අන් ලෙසකින් දීම, වෙන් කර දීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම, ප්‍රවේණි නීතිය යටතේ උරුම වීම, නැතහොත් (ස්වේච්ඡාවෙන් හෝ අධිකරණයක තීරණයක් ක්‍රියාත්මක කිරීම අනුව කෙරෙන) විකිණීම ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා සතු අයිතිවාසිකම්වලට කිසි ලෙසකින් බල නොපාන්නේ ය.

(12) යම් කුඹුරු ප්‍රමාණයක් බුත්තියට ගෙන වැඩ කිරීම පිළිබඳ ව අඳ ගොවියා සතු අයිතිවාසිකම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් පරිදි තහනම් කිරීම, අල්ලා ගැනීම හෝ විකිණීම නොකළ යුතුය.

(13) යම් තැනැත්තකු මේ වගන්තියේ විධිවිධාන කඩ කළහොත් ඔහු වරදක් කරන්නේ ය. මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු ඔහු වරදකරු වූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය. දඩය නොගෙවුව හොත් මාසයකට වැඩි නොවූ කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් වන්නේ ය.

(14) මේ පනතින් හෝ මේ පනත යටතේ යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකුට පැවරුණු යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් ක්‍රියාවෙහි යෙදීමෙන් වැළකී සිටීමට ඔහු පෙළඹවීම, ඔහුට බල කිරීම හෝ ඔහු ඊට කැමති කරවා ගැනීම පිණිස යම් තැනැත්තකු ඒ අඳ ගොවියා කෙරෙහි හෝ ඔහුට විරුද්ධ ව නියම වශයෙන් හෝ අනියම් වශයෙන් යම් බලහත්කාරකමක්, සැහැසි කමක් හෝ අවහිරයක් කළහොත් හෝ කරන බවට තර්ජනය කළහොත් හෝ යම් හානියක්, අලාභයක් හෝ පාඩුවක් සිදු කළහොත් හෝ කරන බවට තර්ජනය කළහොත් මේ වගන්තියේ කාර්යයන් සඳහා ඒ අඳ ගොවියා විසින් කුඹුරු ප්‍රමාණය බුක්ති විඳීමෙහි හා වැඩ කිරීමෙහි ලා ඔහුට ඒ තැනැත්තා බාධා පමුණුවන ලෙස සැලකිය යුතුය.

අස් කිරීමේ කාර්ය පටිපාටිය.

4. (1) යම් කුඹුරු ප්‍රමාණයක් හැර ගොස් එහි සන්තකය යම් නියමිත තැනැත්තකුට භාර දෙන ලෙස විනිශ්චය අධිකාරය විසින් මේ පනත යටතේ ආඥාවක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු ඒ ආඥාව අනු ව ක්‍රියා කිරීම පැහැර හැරි අවස්ථාවක, ඒ ආඥාවෙහි ස්වභාවය සහ එය නිකුත් කරනු ලැබූ තැනැත්තා කවරකු ද යන වග නිශ්චය කෙරෙන්නා වූ ද ඒ ආඥාවට සම්බන්ධ කුඹුරු ප්‍රමාණය විස්තර කෙරෙන්නා වූ ද ඒ ආඥාවෙන් නියමිත පරිදි ඒ තැනැත්තා ඒ කුඹුරු ප්‍රමාණය හැර යාම හෝ හැර ගොස් එහි සන්තකය භාරදීම පැහැර හැර ඇති බව දක්වෙන්නා වූ ද ඒ තැනැත්තා සහ ඒ කුඹුරු ප්‍රමාණයෙහි රැඳී සිටින අන් සියලු ම තැනැත්තන් ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කිරීම පිණිස ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලුම් කෙරෙන්නා වූ ද ඒ කුඹුරු ප්‍රමාණයෙහි සන්තකය භාර දියයුතු තැනැත්තාගේ නම සඳහන් කෙරෙන්නා වූ ද ලිඛිත වාර්තාවක් විනිශ්චය අධිකාරය විසින් නැතහොත් ඒ සඳහා විනිශ්චය අධිකාරය විසින් බලය පවරනු ලබන යම් තැනැත්තකු විසින්, ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් වෙත ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබූ කල්හි ඒ වාර්තාවෙහි නිශ්චිත තැනැත්තා සහ ඒ ආඥාවේ නිශ්චිත ඉඩම් ප්‍රමාණය බුක්ති යට ගෙන සිටින සෙසු සියලු ම තැනැත්තන් අප්‍රමාද ව අස් කොට ඒ ප්‍රමාණයේ සන්තකය භාර දිය යුතු තැනැත්තා ලෙස ඒ වාර්තාවේ සඳහන් තැනැත්තා වෙත ඒ ප්‍රමාණයේ සන්තකය භාර දෙන ලෙස ඒ අධිකරණය විසින් පිස්කල්ට හෝ සාම නිලධරයාට නියම කළ යුතුය.

(3) අස් කිරීමේ ආඥාව ක්‍රියාවෙහි යෙදවීමට භාර දෙනු ලැබූ පිස්කල් විසින් හෝ සාම නිලධරයා විසින් ඒ ආඥාව නිකුත් කළ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නියමයන් අනු ව ක්‍රියා කළයුතු අතර තමා ඒ ආඥාව ක්‍රියාවෙහි යෙදූ ආකාරය පිළිබඳ ව යථා පරිදි අධිකරණය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(4) අස් කිරීමේ ආඥාවක් ක්‍රියාවෙහි යෙදවීමේ දී පිස්කල් හෝ සාම නිලධරයා විසින් නැතහොත් ඉන් කවරකු විසින් වුව ද බලය පවරනු ලැබූ තැනැත්තකු විසින්, ඒ ආඥාව අදාළවන කුඹුරු ප්‍රමාණයට ඇතුළුවීම සඳහා ද ආඥාව නිකුත් කළ මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නියමයන් අනුව ආඥාවෙන් බැඳී සිටින යම් තැනැත්තකු අස් කිරීම සඳහා ද ඒ ප්‍රමාණයේ සන්තකය භාර දීම සඳහා ද අවශ්‍ය විය හැකි බලය යෙදිය හැකිය.

අද ගොවියා සතු යුතුකම්.

5. යම් කුඹුරු ප්‍රමාණයක අද ගොවියා විසින් ඒ කුඹුරු ප්‍රමාණයෙහි ඉඩම් හිමියාට මේ පනතෙහි විධිවිධාන අනු ව ඒ ප්‍රමාණය සම්බන්ධයෙන් බද්දක් ගෙවිය යුතුය.

අද ගොවියාගේ අයිතිවාසිකම් වලට අනුප්‍රාප්තික යකු නම් කිරීම.

6. (1) මෙම පනත යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳ ව, ඒ කුඹුරු ප්‍රමාණය වෙන යම් අද ගොවියකු සමග හවුලේ හෝ තට්ටු මාරුවට වගා කරන අද ගොවියකු හැර සෙසු අද ගොවියකු සතු අයිතිවාසිකම්වලට තමාගේ මරණින් පසු අනුප්‍රාප්තිකයකු ලෙස ශ්‍රී ලංකාවේ පුරවැසියකු නම් කිරීම ඒ කුඹුරු ප්‍රමාණයෙහි අද ගොවියා විසින් කළ හැකිය.

(2) තම අයිතිවාසිකම්වලට යම් අනුප්‍රාප්තිකයකු නම් කිරීමක් කළ අද ගොවියා විසින් කිසියම් විටක ඒ නම් කිරීම අවලංගු කර ඒ සඳහා අලුතින් අනුප්‍රාප්තිකයකු නම් කළ හැකිය.

(3) අද ගොවියකු විසින්, තමාගේ අනුප්‍රාප්තිකයකු නම් කිරීම සහ එබඳු නම් කිරීමක් අවලංගු කළ යුත්තේ—

(අ) දිසාපතිවරයකු, ප්‍රාදේශීය ආදායම් නිලධරයකු, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයකු, නොතාරිස් කෙනකු හෝ සාම විනිශ්චයකාරවරයකු හමුවේ, නියමිත ආකෘතියට අනුකූල ව, පිටපත් දෙකක් සහිත ව සාක්ෂි සමග ලියා අත්සන් කළ ලියවිල්ලක්, හෝ

(ආ) ඒ අද ගොවියාගේ අන්තිම කැමති පත්‍රය

මගිනි.

(4) (3) (අ) වන උපවගන්තියේ නියමිත ලේඛනයක් ලියා අත්සන් කිරීමේදී මුද්දර ගාස්තුවක් ගැනීම හෝ අය කිරීම නොකළ යුතුය.

117 වන අධි.

(5) (3) (අ) වන උපවගන්තියේ නියමිත ලේඛනයක්, ලේඛන ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ කාර්යයන් සඳහා ඉඩම් පිළිබඳ වූ ලේඛනයකැයි නොපිළිගත යුතුය. එසේ ම එකී ආඥාපනතේ II වන පරිච්ඡේදයේ විධිවිධාන, එවැනි ලේඛනයක් ලියා අත්සන් කිරීම සඳහා හමුවට පමුණුවනු ලබන තැනැත්තාට අදාළ නොවිය යුතුය.

(6) (3) (අ) වන උපවගන්තියේ නියමිත ලේඛනයක් එහි සඳහන් කෙරෙන ඉඩම් ප්‍රමාණය පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි නොකළ විට හා කරන තුරු වලංගු නොවිය යුතුය.

(7) මෙම පනත යටතේ යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳ ව, අඳ ගොවියා සතු අයිතිවාසිකම්වලට යම් තැනැත්තකු අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරන, (3) (අ) වන උපවගන්තියේ නියමිත ලේඛනයක් ලියාපදිංචි කිරීමෙන් පසු එම ලියාපදිංචි කළ ලේඛනයෙන් කැරුණු නම් කිරීම, අවලංගු කරන ලේඛනයක් ලියාපදිංචි කිරීමේ මාර්ගයෙන් යථා පරිදි අවලංගු කරන තුරු, වෙන යම් තැනැත්තකු ඒ අයිතිවාසිකම්වලට අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරන, ඒ උප වගන්තියේ නියමිත ලේඛනයක් ලියාපදිංචි නොකළ යුතුය. එකම ලේඛනයකින්, ලියාපදිංචි කළ නම් කිරීමක් අවලංගු කර, ඒ වෙනුවට අනෙක් නම් කිරීමක් ද කළ හැකිය. එසේ වූ කල්හි, අවලංගු කිරීම හා නම් කිරීම එක් ව දක්වෙන ලේඛනය ලියාපදිංචි කළ හැකි වන අතර නිසි පරිදි එය ලියාපදිංචි කළ පසු ව, කලින් ලියාපදිංචි කළ නම් කිරීම අවලංගු කිරීම සහ අලුත් කෙනකු නම් කිරීම යන දෙයාකාරයට ම වලංගු විය යුතුය.

(8) (3) (අ) වන උපවගන්තියේ නියමිත ලේඛනයක් ලියාපදිංචි කරන පිළිවෙළ ද, තැබිය යුතු ලේඛන සහ එසේ ලියාපදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තු ද ඇතුළු ව ඊට සම්බන්ධ වූ හෝ ඊට අදාළ වන්නා වූ සියලු ම කරුණු නියම කැරෙන නියෝග සෑදිය හැකිය.

(9) (6) වන උපවගන්තියේ කාර්යයන් සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා තබන යම් ලේඛනයක් ඔහුගේ කාර්යාලයේ දී නියමිත ගාස්තු ගෙවීමෙන් පසු ව පරීක්ෂා කිරීමට යම් කෙනකුට හිමිකම් තිබේ.

7. (1) යම් කුඹුරු ප්‍රමාණයක් වෙන යම් අඳ ගොවියකු සමඟ හවුලේ හෝ තට්ටු මාරුවට වගා කරන අඳ ගොවියකු හැර සෙසු අඳ ගොවියකු 6 වන වගන්තිය යටතේ අනුප්‍රාප්තිකයකු නම් නොකොට මිය ගිය විට හෝ එම වගන්තිය යටතේ ඔහු නම් කළ අනුප්‍රාප්තිකයා මිය ගිය විට, එම කුඹුරු ප්‍රමාණය පිළිබඳ ව මේ පනත යටතේ ඔහු සතු අයිතිවාසිකම් මේ වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, එම අඳ ගොවියාගේ ඇවෑමෙන් ජීවත්වන ඔහුගේ බිරිඳ වෙත ද එවැන්නකු නැති විට මේ පනතෙහි මූල උපලේඛනයෙහි සඳහන් පිළිවෙළ අනු ව එක වර්ගයක දෙදෙනකුට වැඩි ඥාතීන් සිටින කල්හි ඔවුනතුරෙන් ඉතා ම වැඩිමලාට ද එක වර්ගයේ ඥාතීන් දෙදෙනකු සිටින කල්හි ඔවුන්ගෙන් වැඩිමලාට ද යන වශයෙන් එක් ඥාතියකු වෙත උරුම විය යුතුය. මේ උපවගන්තියේ "ඥාතියා" යන්නෙන් ලේ නෑයකු මිස විවාහයෙන් ඇති වූ නෑයෙක් අදහස් නොවේ.

අනුප්‍රාප්තිකයකු නම් නොකළ විට හෝ එසේ නම් කළ අනුප්‍රාප්තිකයා අඳ ගොවියාට පෙර මිය ගිය විට හෝ ඒ අඳ ගොවියා වෙන යම් අඳ ගොවියකු සමඟ හවුලේ හෝ තට්ටු මාරුවට කුඹුරු ප්‍රමාණයක් වගා කරන විට අඳ ගොවියාගේ අයිතිය අත් හට උරුමවීම.

(2) මිය ගිය අඳ ගොවියකු සතු ව යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් තුබූ අයිතිවාසිකම්, (1) වන උපවගන්තිය යටතේ උරුම වන තැනැත්තා වී ගොවිතැන නුපුරුදු තැනැත්තකු නම්, එකී කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි බලය ලත් ගොවි කාරක සභාව මේ පනතේ වූ උපලේඛනයෙහි සඳහන් අනු පිළිවෙළ අනු ව, මිය ගිය අයගේ, වී ගොවිතැන පුරුදු ඥාතියකු තෝරා එකී අයිතිවාසිකමට උරුමක්කාරයා වශයෙන් පත් කළ යුතු ය. එසේ කළ විට ඒ අයිතිවාසිකම මුලින් සඳහන් තැනැත්තා වෙත නොව, එසේ පත් කළ තැනැත්තා වෙත උරුම වූවක් මෙන් සැලකිය යුතුය.

(3) මියගිය අඳ ගොවියකුගේ අයිතිවාසිකම්වලට (2) වන උපවගන්තිය යටතේ අනුප්‍රාප්තිකයකු පත් කළ විට හා ඒ නිසා, මියගිය අඳ ගොවියා ඇවැමෙන් ජීවත්වන ඔහුගේ බිරිඳ වෙත එකී අයිතිය උරුම නොවන අවස්ථාවක, එසේ පත්කරනු ලැබූ තැනැත්තා, අඳ ගොවියා මියගිය දිනට පෙර වූ අවුරුදු තුන සඳහා ගණින් බලන ලද ඒ කුඹුරු ප්‍රමාණයේ සාමාන්‍ය වාර්ෂික ආදායමේ මුළු ප්‍රමාණයෙන් බදු ගෙවූ පසු ඉතිරිවන ප්‍රමාණයෙන් හතරෙන් එක් කොටසකට සමාන ප්‍රමාණයක් මුදලෙන් හෝ අස්වැන්නෙන් එකී බිරිඳට ගෙවිය යුතුය. එකී ප්‍රමාණය හා එය ගෙවන ආකාරය එම කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලයලත් ගොවි කාරක සභාව විසින් නිශ්චය කළ යුතුය.

(4) යම් කුඹුරු ප්‍රමාණයක් වෙන යම් අඳ ගොවියකු හෝ අඳ ගොවීන් සමඟ හවුලේ හෝ තට්ටු මාරුවට වගා කරන ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියකු මිය ගිය විට ඒ අඳ ගොවියා වශයෙන් ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ ඔහුගේ අයිතිවාසිකම් ඒ වෙන යම් අඳ ගොවියාට හෝ ගොවීන්ට උරුම විය යුතු අතර ඒ අයිතිවාසිකම් ගොවි කාරක සභාව විසින් විධාන කරනු ලබන ආකාරයට ඒ අඳ ගොවියා හෝ අඳ ගොවීන් විසින් පාවිච්චි කළ යුතුය.

අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුම වීම පිළිබඳ ආරාවුල්, විනිශ්චය අධිකාරය විසින් තීරණය කළ යුතු බව.

8. (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය විට, මේ පනත යටතේ ඒ අඳ ගොවියාගේ අයිතිවාසිකම් උරුම විය යුතු තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳ ව ආරාවුලක් ඇති වූ අවස්ථාවක, ඒ ආරාවුල බේරුම් කිරීම සඳහා ඒ ආරාවුලේ පාර්ශ්වකරුවන් විසින්, ආරාවුලට හේතු වූ ඉඩම් ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති විනිශ්චය අධිකාරය වෙත එය යොමු කළ යුතුය. ඒ ආරාවුල පිළිබඳ ව, විනිශ්චය අධිකාරයේ නිශ්චය කිරීම ආරාවුලේ පාර්ශ්වකරුවන් වෙත දැනුම් දිය යුතුය.

(2) ඒ ආරාවුලේ පාර්ශ්වකරුවන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නිශ්චයෙන් අතෘප්ත වූ අවස්ථාවක, ඒ නිශ්චය ඔවුන් වෙත දැනුම් දී දවස් තිහක් ඇතුළත ඔවුන් විසින් ඒ නිශ්චයට විරුද්ධ ව නීති ප්‍රශ්නයක් මත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතු අතර එය කිසි ම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

දේපල ආරක්ෂකයෝ.

9. (1) අවශ්‍ය යයි විනිශ්චය අධිකාරය විසින් සලකනු ලබන විභාග කිරීමෙන් පසු ව මේ පනත යටතේ අඳ ගොවියාගේ අයිතිවාසිකම් බාල වයස් කරුවකුට උරුම වී තිබෙන බවට විනිශ්චය අධිකාරය සෑහීමට පත් වුවහොත් වෙන යම් නීතියක කුමක් සඳහන් වුව ද ඒ බාල වයස්කරුට මේ පනත යටතේ තම අයිතිවාසිකම් පාවිච්චි කිරීමට සහ යුතුකම් ඉටු කිරීමට හැකි කරවීමේ කාර්යය සඳහා ඒ අධිකාරය විසින් ඒ බාල වයස්කරුගේ දේපල ආරක්ෂකයා වීමට යෝග්‍ය වූ ද සුදුසු වූ ද තැනැත්තකු පත් කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ දේපල ආරක්ෂකයකු ඔහුගේ යුතුකම් ඉටු කිරීමට අපොහොසත් වී සිටින බවට හෝ බාල වයස්කරුගේ යහපතට විරුද්ධ හෝ හානිකර ලෙස ක්‍රියා කිරීම හෝ හැසිරීම සම්බන්ධයෙන් වරදකරු වී ඇති බවට හෝ වෙන යම් සෑහෙන හේතුවක් නිසා තවදුරටත් ධුරය දැරීමට දේපල ආරක්ෂකයා නුසුදුසු බවට විභාග කර බැලීමෙන් පසු විනිශ්චය අධිකාරය සෑහීමට පත් වුවහොත්, විනිශ්චය අධිකාරය විසින් ඒ දේපල ආරක්ෂකයා ධුරයෙන් ඉවත් කළ හැකිය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ දේපල ආරක්ෂකයකුට, තමා දේපල ආරක්ෂකයකු වී සිටින්නේ යම් බාල වයස්කරුවකු සඳහා ද ඒ බාල වයස්කරුට අයිති කුඹුරු ප්‍රමාණය පිළිබඳ සියලු ම අයිතිවාසිකම් ලැබිය යුතු අතර ඒවා ඔහු විසින් පාවිච්චි කළ යුතුය. තව ද ඔහු නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් පත් කරනු ලැබූ දේපල ආරක්ෂකයකුගේ සියලු ම බැඳීම්වලට යටත් විය යුතුය.

(4) බාල වයස්කරුගේ දේපල ආරක්ෂක වශයෙන් (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තකු ඒ බාල වයස් කරුගේ දේපල ආරක්ෂක වශයෙන් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වෙන යම් තැනැත්තකු පත් කරනු ලැබූ විට සිය ධුරය දැරීම අවසන් කළ යුතුය.

අඳ ගොවියකුගේ අයිතිවාසිකම් පැවරීම හෝ ආපසු දීම.

10. (1) එසේ කිරීමට තමා අදහස් කරන බව යම් කුඹුරු ප්‍රමාණයක ඉඩම් හිමියා වෙත සහ ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි බලය දරන ගොවි කාරක සභාව වෙත ලියවිල්ලකින් දැන්වීමෙන් පසු ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා විසින්—

(අ) තමා ඒ කුඹුරු ප්‍රමාණය වෙන යම් අඳ ගොවියකු හෝ අඳ ගොවීන් සමඟ හවුලේ හෝ තව්වු මාරුවට වගා කරන හොත් ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ තමාගේ අයිතිවාසිකම් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ ඒ වෙන යම් අඳ ගොවීන්ගෙන් යම් කෙනකුට හෝ ඒ ගොවි කාරක සභාවට පැවරිය හැකිය. එහෙත් සෙසු යම් කෙනකුට පැවරිය නොහැකිය; තව ද

(ආ) තමා ඒ කුඹුරු ප්‍රමාණය වෙන යම් අඳ ගොවියකු හෝ අඳ ගොවීන් සමඟ හවුලේ හෝ තව්වු මාරුවට වගා නොක රතහොත් ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ තමාගේ අයිතිවාසි කම් ස්වකීය භාර්යාවට හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ එසේ ම මේ පනතෙහි වූ උපලේඛනයෙහි සඳහන් අඳ

ගොවියාගේ ඥාතීන්ගෙන් කෙනකුට හෝ ගොවි කාරක සභාවට පැවරිය හැකිය. එහෙත් සෙසු යම් කෙනකුට පැවරිය නොහැකිය.

(2) අවශ්‍ය යයි විනිශ්චය අධිකාරය සලකනු ලබන විභාග පැවැත්වීමෙන් පසු ව, විනිශ්චය අධිකාරය විසින් දෙනු ලබන ලිඛිත අනුමතිය ඇති ව, යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු විසින් ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳ ව තමාගේ අයිතිවාසිකම්, තම ඉඩම් හිමියා ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරු ද වේ නම්, ඒ ඉඩම් හිමියාට ආපසු දිය හැකිය. විනිශ්චය අධිකාරයේ ලිඛිත අනුමතිය නොමැති ව එවැනි අයිතිවාසිකම් පිළිබඳ යම් පවරා දීමක් ශුන්‍ය හා බල රහිත වන්නේ ය.

(3) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන කුමක් වුව ද යම් කුඹුරු ප්‍රමාණයක් පිළිබඳ ව ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා විසින් කරන ලද අනුප්‍රාප්තිකයකු නම් කිරීමක් ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක, මේ වගන්තියේ ඉහත සඳහන් ගොවියාගේ අයිතිවාසිකම් පිළිබඳ ව මේ වගන්තිය යටතේ පැවරීමක් හෝ ආපසු දීමක්, ඒ නම් කිරීම යථා පරිදි අවලංගු කරනු ලැබුවේ නම් මිස හා එසේ කරන තුරු වලංගු නොවන්නේ ය.

අඳ ගොවියාගේ අයිතිය අන් අයට පැවරීමේ ප්‍රතිඵල.

**11.** යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකුගේ අයිතිය ඔහු විසින් අනෙකකුට පැවරූ කල්හි ඒ තැනැත්තා මේ පනතේ විධිවිධාන වලට යටත් ව එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියකු බවට පත් වන්නේ ය.

අඳ ගොවියකුගේ අයිතිවාසිකම් උරුම වීමට අනුප්‍රාප්තිකයකු නොමැති අවස්ථා.

**12.** යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය විට ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අනු ව, මිය ගිය තැනැත්තාගේ අයිතිවාසිකම් මේ පනත යටතේ උරුම වීමට භාර්යාව, ඥාතියකු හෝ නම් කළ තැනැත්තකු නොමැති අවස්ථාවක,—

(අ) ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරු ද වේ නම් තමා ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමි ගොවියා වීමට කැමති බව ඒ අඳ ගොවියා මිය යැමෙන් දෙමසක් ඇතුළත ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි බලය දරන කෘෂිකාර්මික පලදාව වර්ධන කමිටුව වෙත සහ ගොවි කාරක සභාව වෙත ලිඛිත දැන්වීමක් කිරීමෙන් පසු ඔහු විසින් එහි ඉඩම් හිමි ගොවියා වශයෙන් ඒ කුඹුරු ප්‍රමාණයට ඇතුළු වී එය භුක්ති විඳිය හැකිය ; නැතහොත්

(ආ) ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා ඒ කුඹුරු ප්‍රමාණයේ අයිතිකරු නො වේ නම්, හෝ ඒ සඳහා දෙන ලද කාලය තුළ (අ) ඡේදයෙහි සඳහන් ලිඛිත දැන්වීම කිරීමට ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා සහ අයිතිකරු පැහැර හැරියහොත් ගොවි කාරක සභාවේ අදහස් විමසා කෘෂිකාර්මික පලදාව වර්ධන කමිටුව විසින් ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර එසේ පත් කරනු ලැබූ විට ඒ පත් කරනු ලැබූ තැනැත්තා මේ පනතේ විධිවිධානවලට යටත් ව ඒ කුඹුරු ප්‍රමාණයෙහි අඳ ගොවියා බවට පත් වන්නේ ය.

අද ගොවියකුගේ අයිතිවාසිකම් ගොවි කාරක සභාවට පැවරූ විට ඒ ගොවි කාරක සභාව විසින් කළ යුතු වැඩ.

**13.** යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකුගේ අයිතිවාසිකමක් 10 වන වගන්තිය යටතේ ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන ගොවි කාරක සභාව වෙත පවරා දුන් විට ඒ ගොවි කාරක සභාව විසින් එම පැවරීම ගැන ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට ලිඛිත දැන්වීමක් කළ යුතුය. ඉඩම් හිමියාට ඒ පිළිබඳ ව ලිඛිත දැන්වීමක් කිරීමෙන් පසු ගොවි කාරක සභාව විසින් ඒ අයිතිවාසිකම් ඒ කාරක සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ මතය අනු ව එලදායී නො වූ ද යම් කුඹුරු ප්‍රමාණයක ගොවියකුට හෝ ඒ කාරක සභාවේ බල ප්‍රදේශය තුළ පදිංචි ව සිටින යම් ගොවි කුලීකරුවකුට හෝ පැවරිය යුතුය.

ගොවි කාරක සභාවට පවරා දුන් අඳ ගොවි අයිතිවාසිකම් එසේ තබා ගැනීමේ ප්‍රතිඵලය.

**14.** යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු සතු අයිතිවාසිකම් ගොවි කාරක සභාවකට පැවරූ පසු ඒ ගොවි කාරක සභාව මේ පනතේ විධිවිධානවලට යටත් ව, එකී අයිතිය තමන් සතු ව තබා ගන්නා කාලය තුළ අඳ ගොවියකු විය යුතුවාක් මෙන් ම එම කාල සීමාව තුළ මේ පනතේ විධිවිධානවලට අනු ව ඉඩම් හිමියාට එම කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් බදු ගෙවිය යුතුය.

මිය ගිය අඳ ගොවියකුගේ කුඹුරු ප්‍රමාණයේ අයිතිවාසිකම්වලට හිමිකම් නැති තැනැත්තකු ඊට ඇතුළු වී බුත්ති නොවිඳිය යුතු බව.

**15.** (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු මිය ගිය විට මෙම පනත යටතේ, එකී අඳ ගොවියාට ඒ කුඹුරු ප්‍රමාණය පිළිබඳව ඇති අයිතිවාසිකම්වලට හිමිකම් නැති කිසිම තැනැත්තකු එයට ඇතුළු වී බුත්ති විඳීම නොකළ යුතුය.

(2) (1) වන උපවගන්තිය කඩ කොට යම් තැනැත්තකු යම් කුඹුරු ප්‍රමාණයකට ඇතුළු වී බුත්ති විඳිනහොත් එම කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් ලිඛිත නියමයක් මගින්, එම නියමයේ නියමිත දින හෝ ඊට පෙර එම කුඹුරු ප්‍රමාණයෙන් ඉවත් විය යුතු යයි ඒ තැනැත්තාට විධාන කළ යුතුය. ඒ තැනැත්තා එම නියමය නො පිළිපැද්දහොත් ඒ නියමය විනිශ්චය අධිකාරය විසින් කරන ලද නියමයක් සේ සලකා, 4 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල ව ඔහු ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කරනු ලැබිය යුතුය.

අඳ ගොවියකු පත් කිරීමට කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවට ඇති බලය.

**16.** (1) කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් අඳ ගොවියකු නොමැති විට සහ පිට පිට ම එළඹෙන කන්න දෙකක දී හෝ ඊට වැඩි ගණනක දී ඒ කුඹුරු ප්‍රමාණය වගා නො කරනු ලැබූ විට ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි බලය දරන ගොවි කාරක සභාව විමසා, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, ඒ ගොවි කාරක සභාවේ බල ප්‍රදේශයෙහි පිහිටියා වූ සහ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ මතය අනු ව ඵලදායී බැවින් අඩු යම් කුඹුරු ප්‍රමාණයක ගොවියකු හෝ ඒ කාරක සභාව බලය දරන ප්‍රදේශයෙහි පදිංචි යම් ගොවි කුලීකරුවකු, මුලින් සඳහන් කළ කුඹුරු ප්‍රමාණයෙහි හෝ එහි යම් කොටසක අඳ ගොවියා වශයෙන් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් පත් කරනු ලැබිය හැකිය. තව ද එසේ පත් කරනු ලැබූ විට ඒ පත් කරනු ලැබූ තැනැත්තා මේ පනතෙහි විධිවිධානවලට යටත් ව අවස්ථාවෝචිත පරිදි ඒ කුඹුරු ප්‍රමාණයෙහි හෝ එකී කොටසෙහි අඳ ගොවියා වන්නේ ය.

(2) කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් හෝ ඉන් යම් කොටසක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ කිසි ම පත් කිරීමක්,—

(අ) තමන් එසේ කිරීමට අදහස් කරන බව ඒ කුඹුරු ප්‍රමාණයෙහි ඉඩම් හිමියාට ලිඛිත දැන්වීමක් කර දැනුම් දී ඇතහොත් මිස, සහ

(ආ) එවැනි පත් කිරීමක් කිරීමට විරුද්ධ ව සැහෙන හේතු ඒ දැන්වීමෙහි නියමිත කාලය ඇතුලත දැක්වීමට ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියා අපොහොසත් වී ඇතහොත් මිස,

නොකල යුතුය.

(3) (1) වන උපවගන්තියෙහි පළමු ව සඳහන් කල ආකාරයේ යම් කුඹුරු ප්‍රමාණයක හෝ ඉන් යම් කොටසක අවස්ථාවෝචිත පරිදි ඒ කුඹුරු ප්‍රමාණය හෝ කොටස සම්බන්ධයෙන් ඒ උපවගන්තිය යටතේ අඳ ගොවියකු පත් කරනු ලබන අවස්ථාවෙහි එය භුක්ති විඳින යම් තැනැත්තකු සිටින විට ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි බලය දරන කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් ලිඛිත නියමයක් පැවීමෙන්, ඒ නියමයෙහි නියමිත දිනයෙහි හෝ ඊට පෙර ඒ කුඹුරු ප්‍රමාණය හෝ ඒ කොටස හැර යන මෙන් ඒ තැනැත්තාට අණ කල යුතුය. ඒ තැනැත්තා ඒ නියමය අනු ව ක්‍රියා කිරීම පැහැර හැරියහොත් ඒ නියමය විනිශ්චය අධිකාරය විසින් කරන ලද නියමයක් සේ සලකා 4 වන වගන්තියෙහි විධිවිධාන අනු ව ඒ තැනැත්තා ඒ කුඹුරු ප්‍රමාණයෙන් අස් කල යුතුය.

**ගොවි කුලීකරුවන් අඳ ගොවියන් ලෙස පත් කිරීමට ගොවි කාරක සභාව සතු බලය.**

**17.** (1) යම් පරිපාලන දිස්ත්‍රික්කයක මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ ගොවි කුලීකරුවකු හෝ ගොවි කුලීකරුවන් එම දිස්ත්‍රික්කයේ සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි යම් කුඹුරු ප්‍රමාණයක් වගා කරන ගොවියා හෝ ගොවීන් වේ නම්, එසේ ම මෙම පනත යටතේ එම කුඹුරු ප්‍රමාණය වගා කරන ඉඩම් හිමි ගොවියකු හෝ අඳ ගොවියකු ලෙස යම් තැනැත්තකු නො සිටී නම්, එම කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන ගොවි කාරක සභාව විසින් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ ලිඛිත අනුමතිය ඇති ව සහ ලියවිල්ලකින් ඒ ඉඩම් හිමියාට කරන දන්වීමකින් පසු ව, එම ගොවි කුලීකරු එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් පත් කල හැකිය. නැතහොත්, එම ගොවි කුලීකරුවන්ගෙන් එක් එක් අය, එම ගොවි කාරක සභාව නිශ්චය කරන ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා වශයෙන් පත් කල හැකිය.

(2) (අ) ඒ කුඹුරු ප්‍රමාණයෙහි අයිතිකරු 1956 අප්‍රේල් 12 වන දිනයට පෙර එය කුලීකරුවන් යොදවා වගා කරන ලද බවත්, අයිතිකරු විසින් ඒ කුඹුරු ප්‍රමාණයෙහි අස්වැන්නේ ගුණය හා ප්‍රමාණය අතින් සැහෙන උසස් තත්ත්වයක් පවත්වා ගෙන ගොස් ඇති බවත් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවට ඒත්තු ගියහොත් (1) වන උපවගන්තියේ සඳහන් පරිදි ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් ගොවි කුලීකරුවකු පත් කිරීම කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් අනුමත නොකල යුතුය.

(ආ) ඒ කුඹුරු ප්‍රමාණය කෑබලිවලට කැඞීම, වගා කිරීමේ දියුණුවට හේතු නො වේතැයි කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් සලකනු ලැබුවහොත්, ගොවි කුලීකරුවන් ගෙන් එක් එක් තැනැත්තා එම කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන ගොවි කාරක සභාව නිශ්චය කරන කුඹුරු ප්‍රමාණයේ යම් කොටසක අඳ ගොවියා වශයෙන් පත් කිරීම අනුමත නොකළ යුතුය.

(3) ගොවි කාරක සභාවක් (1) වන උපවගන්තිය යටතේ යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු ලෙස ගොවි කුලීකරුවකු පත් කල කල්හි මේ පනතේ විධිවිධානවලට යටත් ව ඔහු අඳ ගොවියෙක් වන්නේ ය.

**ගොවි කුලීකරුවන්ගේ වැටුප්.**

18. ගොවි කුලීකරුවකු වැඩට යොදවන යම් තැනැත්තකු විසින් එම කුලීකරු වැඩට යොදවන ස්ථානය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන ගොවි කාරක සභාව විමසා කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් ගොවි කුලීකරුවන් සඳහා නියම කරන ලද වැටුප් ප්‍රමාණවලින් යෝග්‍ය ප්‍රමාණය අනුව එම කුලීකරුට වැටුප් ගෙවිය යුතුය.

**යම් කුඹුරු ප්‍රමාණයක් වගා නොකිරීම, ඉඩම් හිමියාට සහ ගොවි කාරක සභාවට නිවේදනය කළ යුතු බව.**

19. යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු, වී ගොවිතැන් කරන යම් කන්නයක ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීමට අපොහොසත් වූ අවස්ථාවක, ඒ කන්නයෙහි දී තමා ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීමට අපොහොසත් බව ඔහු විසින් ඒ කන්නය ආරම්භ වීමේ දී ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට සහ ඒ කුඹුරු ප්‍රමාණය පිහිටි ප්‍රදේශයෙහි බලය දරන ගොවි කාරක සභාවට ලියවිල්ලකින් නිවේදනය කළ යුතුය.

## II වන කොටස

### I වන පරිච්ඡේදය

### අඳ ගොවීන් ගෙවිය යුතු බද්ද

**අමාත්‍යවරයා විසින් බද්ද නිශ්චය කළ යුතු බව.**

20. (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා විසින් ගෙවිය යුතු බද්ද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍ය වරයා විසින් මේ වගන්තියේ විධිවිධාන අනු ව කලින් කල නිශ්චය කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන නිශ්චයෙන්, එම නිශ්චය බලපාන ප්‍රදේශයේ පිහිටි යම් කුඹුරු ප්‍රමාණයක වගා කළ එක් එක් කුඹුරු අක්කරයකින් වී බුසල් පසළොවකට නොවැඩි ගණනක් හෝ එම කුඹුරු ප්‍රමාණයෙන් උපදවන මුළු අස්වැන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනතේ විධිවිධාන යටතේ නියමිත අය කිරීමේ ප්‍රමාණය අඩු කළ විට ඉතිරි කොටසින් හතරෙන් එක් පංගුවකට නොවැඩි කොටසක් හෝ ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් මේ දක්වා සිරිත් පරිදි ගෙවිය යුතු බද්ද යන මේවායින් අඩු ම ප්‍රමාණය ඒ කුඹුරු ප්‍රමාණය ගොවිතැන් කරන එක් එක් කන්නය සඳහා ගෙවිය යුතු බද්ද වශයෙන් නියම කළ යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිශ්චය කරන බද්ද විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් හෝ එක ම පරිපාලන දිස්ත්‍රික්කයේ විවිධ කොටස් සම්බන්ධයෙන් වෙනස් විය හැකිය.

(4) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිත බද්ද, ගොවිතැන් කළ අක්කරයක් සඳහා නියමිත වී බුසල් ගණන අනු ව ගණන් බලනු ලබන විට ගොවිතැන් කරන ලද අක්කරයකට අඩු බිම් ප්‍රමාණයක් සඳහා වූ බද්ද ඒ බිම් ප්‍රමාණයත් අක්කරයත් අතර ඇති අනුපාතය අනු ව ගණන් බැලිය යුතුය.

(5) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා එක් එක් කන්නයෙහි දී ගෙවිය යුතු බද්ද—

(අ) මේ වගන්තියේ ඉහත කී විධිවිධාන යටතේ බලපවත්වන නිශ්චය අනු ව එම කුඹුරු ප්‍රමාණය පිහිටි ප්‍රදේශයේ කුඹුරු කෙරෙහි අදාළ වන ආකාරයෙන් එම කුඹුරු ප්‍රමාණයට ගණන් ගත් වී ප්‍රමාණය, හෝ

(ආ) ඉඩම් හිමියා බද්ද මුදලින් ලබා ගැනීමට කැමති වූ විට සහ අඳ ගොවියා බද්ද මුදලින් ගෙවීමට එකඟ වූ විට එකී කුඹුරින් නිපද වූ වර්ගයේ ම වී සඳහා එවකට කවර හෝ නීතියක විධිවිධානවලට අනුකූල ව නියම කරන ලද මිල අනු ව ගණන් බැලූ මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ වීවලින් ගෙවිය යුතු බද්දට සමාන මුදල

විය යුතුය.

(6) කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක බල ප්‍රදේශය තුළ සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි යම් කුඹුරු ප්‍රමාණයක් ගොවිතැන් කළ හැකි ව තිබෙන යම් කන්නයක ඒ කුඹුරු ප්‍රමාණය ගොවිතැන් කිරීම එහි අඳ ගොවියා විසින් ඕනෑකමින් ම නොසලකා හැර ඇතැයි හෝ වී ගොවිතැන් කරන යම් කන්නයක දී සෑහෙන හේතුවක් නොමැති ව ගොවිතැන් කිරීමට අදාළ යම් සම්මත සිරිතක් කඩ කර ඇතැයි එම කමිටුවට ඒත්තු ගිය විට, එම කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ ඒ කන්නය සඳහා වීවලින් ගෙවිය යුතු බද්ද ඒ කමිටුව විසින් නිශ්චය කරන පදනම මත ගණන් බැලිය යුතු අතර එසේ ගණන් බලන ලද වීවලින් ගෙවිය යුතු බද්ද අනු ව මුදලින් ගෙවිය යුතු බද්ද ගණන් බැලිය යුතුය.

(7) අඳ ගොවියකු වගා කළ කුඹුරු ප්‍රමාණයක් වී ගොවිතැන් කරන යම් කන්නයක දී ඔහුගේ වරදින් හෝ නොසැලකිල්ලකින් නොව අන් කිසි හේතුවක් නිසා තරමක් දුරට පාළු වී නම් එම කුඹුරු ප්‍රමාණය වෙනුවෙන් ඔහු විසින් ඒ කන්නය සඳහා ගෙවිය යුතු බද්ද එම කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් නිශ්චය කරන සාධාරණ ප්‍රමාණයකින් අඩු කළ යුතුය.

(8) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියා සහ ඔහුගේ ඉඩම් හිමියා අතර ඒ කුඹුරු ප්‍රමාණය සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නිශ්චය කිරීමක් යටතේ ගෙවිය යුතු බදු මුදල පිළිබඳ ව යම් ආරාවුලක් ඇති වූ විට ඒ පිළිබඳ ව තීරණයක් කිරීම සඳහා ඒ ආරාවුල ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි බලය දරන විනිශ්චය අධිකාරය වෙත යොමු කළ හැකිය. ඒ ආරාවුල සම්බන්ධයෙන් විනිශ්චය අධිකාරයේ තීරණය ඒ අඳ ගොවියා හෝ ඔහුගේ ඉඩම් හිමියා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. විනිශ්චය අධිකාරයේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතුය.

බද්ද නොගෙවිය යුතු අවස්ථා.

21. අඳ ගොවියකුගේ කුඹුරු ප්‍රමාණය වී ගොවිතැන් කරන යම් කන්නයක දී ඔහුගේ වරදකින් හෝ නොසැලකිල්ලකින් නොව, අන් කිසි හේතුවක් නිසා වගා නොකරන ලද නම් හෝ එම කන්නය තුළ ඒ කුඹුරු ප්‍රමාණයේ කළ වගාව සහමුලින් ම පාළු වී නම්, ඒ ප්‍රමාණය වෙනුවෙන් එම කන්නය සඳහා බද්දක් අය නොකළ යුතුය.

බද්ද ගෙවිය යුතු කාලය, ස්ථානය සහ බද්ද හිඟ වීමට පටන් ගැනීම.

22. යම් කුඹුරකින් වී ගොවිතැන් කරන යම් කන්නයක් සඳහා ගෙවිය යුතු බද්ද එම කන්නයේ දී එම කුඹුරු ප්‍රමාණයෙන් අස්වැන්න ලබා ගැනීමෙන් අනතුරු ව තිස් වන දිනයේ හෝ ඊට පෙර කමතේ දී ගෙවිය යුතුය. එසේ නොගෙව්ව හොත් එකී තිස් වන දිනයට පසු පළමු වන දිනයේ පටන් බද්ද හිඟ වීමට පටන් ගනී.

ගොයම් කපා පාගා ගැනීමේ සහ ඉවත් කර ගැනීමේ දින අඳ ගොවියා විසින් ඉඩම් හිමියාට සහ ගොවි කාරක සභාවට දැන්විය යුතු බව.

23. යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් සිය ඉඩම් හිමියා සහ ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන ගොවි කාරක සභාව වෙත—

(අ) ඒ කුඹුරු ප්‍රමාණයේ අස්වැන්න කපා පෑගීම ආරම්භ කිරීමට අදහස් කරන දිනය යටත් පිරිසෙයින් දින දහයක් කල් ඇතිව දැන්වීම, සහ

(ආ) කුඹුරු ප්‍රමාණයෙන් කපා පාගා ගන්නා ලද අස්වැන්න කමතෙන් ඉවත් කර ගැනීමට අදහස් කරන දිනය යටත් පිරිසෙයින් දින හතක් කල් ඇතිව දැන්වීම,

ඒ කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියාගේ යුතුකම වන්නේය.

කාහට බද්ද ගෙවිය යුතු ද යන බව.

24. (1) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා බද්ද එහි අඳ ගොවියා විසින් එම කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට කෙලින් ම හෝ එම කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ මාර්ගයෙන් ගෙවිය යුතුය.

(2) යම් කුඹුරු ප්‍රමාණයක අයිතිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් වූ විට එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියාගෙන් බද්ද අය කර ගැනීම සඳහා ඔවුන් විසින් එක් තැනැත්තකු පත් කළ යුතුය. ඒ සඳහා පත් කළ තැනැත්තාගේ නම සහ ලිපිනය ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව වෙත ලියවිල්ලකින් දන්වා යැවිය යුතුය. එසේ පත්වීමක් නොකළ කල්හි, එම බද්ද එම කුඹුරු හිමියන් වෙනුවෙන් සිරිත් පරිදි එවැනි බදු අය කරන යම් තැනැත්තකු වෙතොත් ඒ තැනැත්තාට කෙලින් ම හෝ එකී කමිටුව මගින් හෝ ගෙවිය යුතුය. ඒ බද්ද එකතු කිරීමට හිමිකම් ඇති තැනැත්තකු නොමැති නම් හෝ ඒ බද්ද ඒ ඉඩම් හිමියන්ට කවර අනුපාතයක් අනු ව ගෙවිය යුතු ද යන්න පිළිබඳ ව හෝ ඒ බද්ද ගෙවනු ලැබිය යුතු තැනැත්තා පිළිබඳ ව යම් ආරවුලක් ඇති වුව හොත් මේ පනතේ විධිවිධාන අනු ව ගණන් බැලූ ඒ බද්ද ඒ අඳ ගොවියා විසින් ඒ කමිටුවට ගෙවිය යුතු අතර ඒ කමිටුව විසින් ඒ මුදල එයට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින් එය ලබා ගැනීම පිණිස ඒ බද්ද ගැන ක්‍රියා කිරීමේ දී ඒ කමිටුව විසින් දරන ලද වියදම් එයින් අඩු කොට, මුදල රුපියල් හත්සිය පනහකට වැඩි වීම හෝ අඩු වීම අනු ව ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ

ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි අධිකරණ බලය දරන දිසා අධිකරණයට හෝ රික්වෙස්ට් අධිකරණයට ගෙවිය යුතුය. ඒ මුදල හෝ ඉන් යම් කොටසක් ඒ මුදල අධිකරණයට ගෙවනු ලැබූ දින යෙන් පසු අවුරුද්දක් ඇතුළත එයට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින් ලබා ගනු නොලැබූ අවස්ථාවක ඒ අධිකරණය විසින් ඒ මුදල කෘෂිකාර්මික පලදා වර්ධන අරමුදලට ගෙවීමට සැලැස්විය යුතුය. ඒ මුදල් ප්‍රමාණය හෝ එයින් දැක්වෙන බද්ද ඉල්ලා සිටීමට හෝ භාර ගැනීමට ඉන් පසු කිසි ම තැනැත්තකුට හිමිකම් නැත්තේ ය.

(3) යම් කුඹුරු ප්‍රමාණයක් අයිති ඉඩම් හිමියකුගෙන් අය විය යුතු යම් මුදලක් එම කුඹුරු ප්‍රමාණයේ අඳ ගොවියා එම ඉඩම් හිමියාට ගෙවිය යුතු බද්දෙන් අය කළ යුතු යයි මේ පනතේ යම් විධි විධානයකින් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවකට බලය පවරා දී ඇති කල්හි එසේ කළ යුතු යයි කමිටුව විසින් අඳ ගොවියාට ලිය විල්ලකින් විධාන කල විට හා කරන තාක් කල් ඔහු විසින් බද්ද කමිටුවට ගෙවිය යුතුය. කමිටුව නිශ්චය කරන ආකාරයෙන් එම මුදල බද්දෙන් අඩු කර ගෙන ඉතිරි වූ යමක් වෙතොත් එය කුඹුරු හිමියාට ගෙවිය යුතුය. බද්දෙන් අඩු කළ ගණන් පිළිබඳ සවිස්තර ප්‍රකාශයක් ඉඩම් හිමියාට සැපයිය යුතුය.

කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් මගින් ඉඩම් හිමියාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිත යාට බද්ද ගෙවන අවස්ථාවෙහි දී අදාළ විය යුතු විධිවිධාන.

25. (1) යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියකු විසින් ඒ කුඹුරු ප්‍රමාණයෙහි බද්ද ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම් හිමියාට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට ගෙවනු වෙනුවට ඒ කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයෙහි බලය දරන කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවට ගෙවනු ලබන අවස්ථාවක, ඒ කමිටුව විසින්—

(අ) ඒ බද්ද මුදලින් ගෙවනු ලැබුයේ නම්, ඒ බදු මුදල් ප්‍රමාණය අවස්ථාවෝචිත පරිදි ඒ ඉඩම් හිමියා වෙත හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා වෙත යැවීමට සැලැස්විය යුතුය ; නැතහොත්

(ආ) ඒ බද්ද වීවලින් ගෙවනු ලැබුයේ නම්, දැන්වීමේ දිනයෙන් පසු දින තිහක් ඇතුළත ඒ බද්ද බාරගන්නා මෙන් ඉල්ලා අවස්ථාවෝචිත පරිදි ඒ ඉඩම් හිමියා වෙත හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයා වෙත ලිඛිත දැන්වීමක් යැවීමට සැලැස්විය යුතුය.

(2) කුඹුරු ප්‍රමාණයක බද්ද කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව කට වීවලින් ගෙවනු ලැබුවා වූ ද එයට හිමිකම් ඇති තැනැත්තා වෙත යවනු ලැබූ (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමෙහි දින යෙන් පසු තිස් දිනක් ඇතුළත ඔහු එය ඉල්ලා සිටීම කර නැත්තා වූ ද අවස්ථාවක ඒ කමිටුව විසින් ඒ වී විකුණා ඒ විකිණීමෙන් ලැබෙන මුදල ඒ තැනැත්තා වෙත යැවීමට සැලැස්විය හැකිය.

(3) කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් මේ වගන්තිය යටතේ යම් තැනැත්තකුට (මුදල් ඇණවුමකින් හෝ තැපැල් ඇණවුමකින් නොවන අන් ලෙසකින්) යවනු ලැබූ යම් මුදලකට ඒ මුදල යවනු ලැබූ දිනයෙන් පසු අවුරුද්දක් ඇතුළත ඒ තැනැත්තා විසින් හිමිකම් කියා නොසිටි අවස්ථාවක ඒ මුදල ඒ කමිටුව විසින්

කෘෂිකාර්මික පලදා වර්ධන අරමුදලට ගෙවිය යුතුය. ඒ මුදල හෝ, ඒ මුදල යම් බද්දක් වෙනුවෙන් වූ විට ඒ බද්ද ඉල්ලා සිටීමට හෝ බාර ගැනීමට ඉන් පසු කිසිම තැනැත්තකුට හිමිකම නැත්තේය.

(4) මේ වගන්තියෙහි ඉහත සඳහන් විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, යම් තැනැත්තකුට අය විය යුතු බද්ද යැවීම හෝ ඒ පිළිබඳ ව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් විසින් දරන ලද සියලු ම වියදම් ඒ තැනැත්තා විසින් ඉසිලිය යුතු අතර ඒ බද්ද කමිටුව විසින් ඒ තැනැත්තාට යැවීමට හෝ ගෙවීමට පෙර ඒ වියදම් කමිටුව විසින් ඒ බද්දෙන් අඩු කර ගත හැකිය.

26. (1) යම් කුඹුරු ප්‍රමාණයක් සඳහා බදු එකතු කිරීමට අයිතිය ඇත්තකු බද්ද භාර ගත් කල්හි— *ගෙවූ බද්ද සඳහා කුවිතාන්සියක් දිය යුතු බව.*

(අ) ගෙවූ දිනය ;

(ආ) බදු ගෙවූ තැනැත්තා ;

(ඇ) ගෙවන ලද බදු මුදලේ ප්‍රමාණය ;

(ඈ) බදු ගෙවන ලද කාල සීමාව ; සහ

(ඉ) බදු ගෙවන ලද්දේ කුමන කුඹුරක් සම්බන්ධයෙන් ද

යන කරුණු සඳහන් කුවිතාන්සියක් එම බද්ද ගෙවූ තැනැත්තාට නිකුත් කළ යුතුය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කළහොත් ඔහු වරදක් කරන අතර මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේය.

27. යම් කුඹුරු ප්‍රමාණයක බද්ද හිඟ බවට පැමිණි විට පනතේ විධිවිධාන අනු ව ගණන් බැලූ හිඟ බද්ද වෙනුවෙන් නියමිත ප්‍රමාණයක සුළු පොලියක් ගෙවිය යුතුය. *හිඟ බද්ද වෙනුවෙන් පොලී ගෙවිය යුතු බව.*

28. යම් කුඹුරු ප්‍රමාණයක අඳ ගොවියාගෙන් හිඟ බවට පැමිණි බදු වශයෙන් හෝ ඒ බද්ද වෙනුවෙන් පොලී වශයෙන් නැතහොත් ඒ දෙවිධියෙන්ම ඔහුගේ ඉඩම් හිමියාට යම් මුදලක් අයවිය යුතු ව ඇති විට, නියමයක් කරන ලෙස, ඒ ඉඩම් හිමියා විසින් විනිශ්චය අධිකාරයට ඉල්ලුම් කළ හැකි අතර එසේ ඉල්ලුම් කරනු ලැබූ විට, යථා පරිදි විභාගයක් පැවැත්වීමෙන් පසු, විනිශ්චය අධිකාරය විසින්, ඒ අඳ ගොවියාගෙන් අයවිය යුතු ව ඇති කවර හෝ මුදලක් ගෙවන ලෙස අඳ ගොවියාට නියමයක් කළ යුතුය. ඒ නියමයෙන් දෙන ලද කාලය තුළ ඒ මුදල ගෙවීම ඒ අඳ ගොවියා විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඒ නියමය, ඒ මුදලට හිමිකම් ඇති තැනැත්තාගේ වාසියට හා අඳ ගොවියාට විරුද්ධ ව සිවිල් අධිකරණයක් විසින් කරන ලද තීන්දු ප්‍රකාශයක් වූවක් මෙන් අය කර ගත හැකිය. ඒ අනු ව එබඳු තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමෙහි ලා සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ වන්නේය. *හිඟ බවට පැමිණි බදු සහ පොලී අයකර ගැනීම.*

## II වන පරිච්ඡේදය

### නියමිත බැංකු විසින් දෙනු ලබන ණය සම්බන්ධයෙන් අදාළ කළ හැකි විධිවිධාන

මේ පරිච්ඡේදය අදාළ කිරීම.

**29.** (1) නියමිත බැංකුවක් විසින් දෙනු ලැබූ ණයක් සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයේ කවර විධිවිධානයක් වුව ද අදාළ වන්නේ ය.

(2) මේ පරිච්ඡේදයේ "ණය" යන්නට අත්තිකාරමක්, අයිරාවක් හෝ වෙනත් කිසි යම් අනුග්‍රහ මුදලක් සහ ඒ සඳහා වූ පොලියක් ඇතුළත් වේ.

(3) මේ පරිච්ඡේදයේ "බුත්තිකරු" යන්නෙන් බදු ගැනුම්කරු හෝ පොලී මරා උකස් හිමි වීම නිසා තත්කාලයේ කෘෂිකාර්මික ඉඩම ප්‍රයෝජනයට ගැනීමට හෝ බුත්ති විඳීමට හිමිකම් ලබා ඇති තැනැත්තා අදහස් වන අතර ඊට ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ සතු කර දෙන ලද කෘෂිකාර්මික ඉඩම් ප්‍රයෝජනයට ගන්නා හා බුත්ති විඳින තැනැත්තෝ ඇතුළත් වන්නාහ. තව ද මේ පනතේ අර්ථානුකූල අඳ ගොවියෙක් සහ කෘෂිකාර්මික කම්කරුවෙක් ද ඊට ඇතුළත් වෙති.

(4) මේ පරිච්ඡේදයේ "අයිතිකරු හෝ බුත්තිකරු" යන්නෙන් වයස අවුරුදු දහ අට සම්පූර්ණ කර සිටින තැනැත්තෙක් අදහස් වේ.

ඉඩම් උකස් කරයේ ආකෘතිය.

**30.** (1) නියමිත බැංකුවක් විසින් තමාට දෙනු ලැබූ හෝ දෙනු ලබන ණයක් වෙනුවෙන්, යම් කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු හෝ බුත්තිකරු විසින් තමාට අයිති හෝ තමාට සම්බන්ධතාවක් ඇති ඉඩමක් හෝ වෙනත් යම් නිශ්චල දේපලක් උකස් කිරීම හෝ ඒ සම්බන්ධයෙන් බැඳීමක් ඇති කිරීම නියමිත ආකෘතියට සරිනුකූල වූ සාධන පත්‍රයක් පිටපත් දෙකකින් යුක්ත ව ලියා අත්සන් කිරීමෙන් කළ හැකිය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් සාධන පත්‍රයක් සඳහා අය කළ හැකි මුද්දර ගාස්තුව, ඒ හා සමාන බැඳුම්කරයක් හෝ උකස්කරයක් සඳහා මුද්දර ආඥාපනතේ "අ" උපලේඛනය යටතේ අය කළ හැකි ගාස්තුවෙන් පහෙන් පංගුවකට සමාන ගාස්තුවක් පමණක් වේ. ඒ ගාස්තුව සාධන පත්‍රයේ අනු පිටපත සඳහා ගෙවිය යුතු අතර ඒ සාධන පත්‍රයේ මුල් පිටපත හෝ එහි ප්‍රතිරූප පිටපත, ඒ සඳහා ගෙවිය යුතු කිසියම් ගාස්තුවක් වේ නම් එයින්, නිදහස් වෙයි.

(3) සෑම නියමිත බැංකුවක් ම—

(අ) මේ වගන්තිය යටතේ ඒ බැංකුවේ වාසියට ලියා අත්සන් කරනු ලබන සාධන පත්‍ර ඒවා ලියා අත්සන් කරනු ලබන අනු පිළිවෙළ අනු ව අනුගාමී පූර්ණ සංඛ්‍යාවලින් අංක කරනු ලැබීමට සැලැස්විය යුතුය ;

(ආ) එක් එක් මාසයේ පසළොස් වන දිනට පෙර, ඒ මාසයට කලින් වූ මාසය තුළ ඒ බැංකුවේ වාසියට ලියා අත්සන් කරන ලද එබඳු සියලු ම සාධන පත්‍රවල දෙවන පිටපත්

ඒ සාධන පත්‍රවල ලැයිස්තුවක් ද සමග, ඒ නියමිත බැංකුව තම කටයුතු කරන දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාරදීම හෝ යැවීම කළ යුතුය;

(ඇ) එක් එක් සතියේ බදාදා හෝ ඊට පෙර ලැබෙන ලෙස, ඒ සතියට කලින් වූ සෙනසුරාදා දිනයෙන් අවසන් වන සතිය තුළ ඒ බැංකුවේ වාසියට ලියා අත්සන් කරන ලද එබඳු සාධන පත්‍රවල ලැයිස්තුවක්, ඒ නියමිත බැංකුව තම කටයුතු කරන දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාරදීම හෝ යැවීම කළ යුතුය;

(ඈ) එබඳු යම් සාධන පත්‍රයක් නියමිත බැංකුව තම කටයුතු කරන දිස්ත්‍රික්කය නොවන දිස්ත්‍රික්කයක පිහිටි යම් ඉඩමක් හෝ නිශ්චල දේපලක් කෙරෙහි බලපාන්නේ නම්, ඒ සාධන පත්‍රයේ පිටපතක් එම ඉඩම හෝ නිශ්චල දේපල පිහිටි දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් වෙත එසේ දෙවැනු කී දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම්වලට හෝ නිශ්චල දේපලවලට අදාළ එබඳු සියලු ම සාධන පත්‍රවල ලැයිස්තුවක් ද සමග ඊළඟ මාසයේ පසළොස්වන දින හෝ ඊට ප්‍රථම භාරදීම හෝ යැවීම කළ යුතුය; තව ද

(ඉ) ඒ සාධන පත්‍රය ඇටෝර්නි බලකරුවකු විසින් ලියා අත්සන් කරනු ලැබුවේ නම් ඒ ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක්, සාධන පත්‍රයේ පිටපතක් ද සමග ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් කවර වූ හෝ සාධන පත්‍රයක් අත්සන් කිරීම ණය මුදල දෙන බැංකුවේ ශාඛාවේ හෝ කාර්යාලයේ කළමනාකරු හෝ ඒ බැංකුවේ යම් නියමිත තනතුරක් දරන යම් තැනැත්තකු සහ තවත් සාක්ෂිකරුවකු ද ඉදිරියේ කළ හැකි අතර එය ලියා අත්සන් කිරීම සහතික කිරීම ඒ කළමනාකරු හෝ ඒ වෙනත් තැනැත්තා සහ එකී සාක්ෂිකරු විසින් ද කළ හැකිය; තව ද ඒ සාධන පත්‍රය එසේ අත්සන් කරනු ලැබ සහතික කරනු ලැබූ අවස්ථාවක, වංචා වැලැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ කිසිවක් එයට අදාළ නොවන්නේය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් යම් ලේඛනයක් ඉඩම් කෙරෙහි බලපෑමක් ඇති සාධන පත්‍රයක් වශයෙන් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකිය.

31. නියමිත බැංකුවක් විසින් යම් කෘෂිකාර්මික ඉඩමක අයිතිකරුවකුට හෝ බුත්තිකරුවකුට දෙන ලද ණයක් වෙනුවෙන් අයවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ මුදල අය විය යුත්තේ මුල් මුදලින් හෝ පොලියෙන් හෝ දෙකින් ම හෝ වුව ද, ඒ ණය මුදලේ නොගෙවා ඇති සම්පූර්ණ කොටස හා ඊට අදාළ පොලිය ගෙවීම පැහැර හැරීමක් ලෙස එය සැලකිය යුතුය. *ගෙවීම පැහැර හැරීම.*

32. (1) මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ; යම් ණයකින් නොබේරූ හෝ නොපියවූ සම්පූර්ණ කොටස් සහ ඊට අයත් පොලිය ගෙවීම් පැහැර හරිනු ලැබූ හෝ පැහැර හරිනු ලැබූ ලෙස සැලකෙන අවස්ථාවක, එම ණය දෙනු ලැබුවේ යම් කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද ඒ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරු *ගෙවීම් පැහැර හරිනු ලැබූ අවස්ථාවක නියමිත බැංකුව විසින් ගත යුතු ක්‍රියා මාර්ගය.*

හෝ බුත්තිකරු දැන්වීමේ සඳහන් මුදල ගෙවීම පැහැර හැර ඇති බව ඒ කෘෂිකාර්මික ඉඩම පිහිටියේ යම් විනිශ්චය අධිකාරයක බල ප්‍රදේශය තුළ ද ඒ විනිශ්චය අධිකාරය වෙත නියමිත බැංකුව විසින් නිවේදනය කළ යුතුය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීමක් ලැබුණු පසු, ඒ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරු හෝ බුත්තිකරු ඒ මුදල ගෙවීම පැහැර හැර තිබේ ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා විනිශ්චය අධිකාරය විසින් විභාගයක් පැවැත්විය හැකිය.

(3) ඒ විභාගයේ දී පෞද්ගලික ව හෝ නියෝජිතයකු මගින් කරුණු කියා සිටීමේ අවස්ථාවක් කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරුට හෝ බුත්තිකරුට සහ නියමිත බැංකුවට දෙනු ලැබිය යුතුය.

(4) කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරුගෙන් හෝ බුත්තිකරුගෙන් නියමිත බැංකුවට යම් මුදලක් අය විය යුතු බවට ඒ විභාගයේ දී විනිශ්චය අධිකාරය සෑහීමට පත් වුවහොත්, නියමිත බැංකුවට අය විය යුතු මුදල නියමිත ආකාරයෙන් ගෙවන ලෙස විනිශ්චය අධිකාරය විසින් ඒ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරුට හෝ බුත්තිකරුට හෝ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරුගේ හෝ බුත්තිකරුගේ උරුමක්කාරයකුට හෝ නීත්‍යනුකූල නියෝජිතයකුට නියම කළ හැකිය.

(5) විනිශ්චය අධිකාරයේ යම් තීරණයකින් හෝ නියමයකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවකු විසින්, ඒ තීරණය හෝ නියමය ඔහුට දැනුම් දෙනු ලැබීමෙන් පසු තිස් දිනක් ඇතුළත, අනික් තැනැත්තා වගඋත්තරකරුවකු වශයෙන් සඳහන් කර ඇති ලිඛිත පෙත්සමක් මගින් නීති ප්‍රශ්නයක් මත ඒ තීරණයට හෝ නියමයට විරුද්ධ ව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කළ හැකිය.

(6) (5) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයක් ගැන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙනු ලබන තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

(7) විනිශ්චය අධිකාරය විසින් (4) වන උපවගන්තිය යටතේ තීරණයක් හෝ නියමයක් කරනු ලැබ, ඒ තීරණයට හෝ නියමයට විරුද්ධ ව අභියාචනයක් ඒ සඳහා ඉඩ ලැබී ඇති කාලය ඇතුළත ඉදිරිපත් කරනු නොලැබ ඇත්නම් හෝ ඒ තීරණය හෝ නියමය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ථිර කර ඇත්නම්, විනිශ්චය අධිකාරය විසින් ලිඛිත නියමයක් මගින්, ඒ නියමයේ සඳහන් දිනයේ හෝ ඊට පෙර, නියමිත බැංකුවට අය විය යුතු මුදල වශයෙන් විනිශ්චය අධිකාරය විසින් නිශ්චය කරනු ලැබූ මුදල නියමිත බැංකුවට ගෙවන ලෙස කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරුට හෝ බුත්තිකරුට ලියවිල්ලකින් නියම කළ යුතුය.

(8) නියමිත බැංකුවට ගෙවීමට තමාට නියම වූ යම් මුදලක් සම්බන්ධයෙන් (7) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකට අනුකූල ව ක්‍රියා කිරීම කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරු හෝ බුත්තිකරු පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, එම කෘෂිකාර්මික ඉඩම පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයට නියමිත බැංකුව වෙනුවෙන් යම්

තැනැත්තකු විසින් කරන ලද ඉල්ලීමක් අනු ව එම මුදල, එය එම අධිකරණය විසින් ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩ ප්‍රමාණය ඉක්ම වන්නේ වුව ද ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අය කරගන්නා ආකාර යෙන් අය කර ගත හැකිය.'

*නියමිත බැංකුව විසින් දෙන ලද ණයක් නිසා ඇති වූ බැඳීමක ප්‍රමුඛත්වය.*

**33.** (1) තත්කාලයෙහි බලපවත්වන කිසියම් නීතියක පටහැනි ව කුමක් සඳහන් ව ඇත ද, නියමිත බැංකුවක් විසින් යම් කෘෂිකාර්මික ඉඩම් අයිතිකරුවකුට හෝ බුත්තිකරුවකුට දෙන ලද ණයක් සම්බන්ධයෙන් යම් ඉඩමක් හෝ එහි සම්බන්ධතාවක් කෙරෙහි නියමිත බැංකුවක වාසියට ඇති කරන ලද යම් බැඳීමක් හෝ උකසක්, එම බැඳීම හෝ උකස ඇති කරන ලද දිනයට පෙරාතුව එම ඉඩම හෝ එහි සම්බන්ධතාව කෙරෙහි යම් තැනැත්තකුගේ වාසියට ඇති කරනු ලැබ තිබිය හැකි වෙනත් යම් බැඳීමකට හෝ උකසකට වඩා ප්‍රමුඛත්වය ලැබිය යුතුය.

(2) නියමිත බැංකුව විසින් දෙන ලද ණය මුදල සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක්, අවස්ථාවෝචිත පරිදි, බෝග හෝ කෘෂි ද්‍රව්‍ය වගා කිරීම හෝ ගවයන්, සත්වාහාර හෝ කෘෂිකර්ම උපකරණ මිලදී ගැනීම සඳහා කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු විසින් හෝ බුත්තිකරු විසින් යොදවනු ලැබ තිබූ අවස්ථාවක, ඒ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරුගෙන් හෝ බුත්තිකරුගෙන් බැංකුවට අයවිය යුතු හෝ ඔවුන් විසින් බැංකුවට ගෙවිය යුතු යම් ණයක්—

(i) බෝග හෝ වෙනත් කෘෂි ද්‍රව්‍ය ; සහ

(ii) ගවයන්, සත්වාහාර හෝ කෘෂිකර්ම උපකරණ

කෙරෙහි පළමු බැඳීමක් වන්නේය.

*ආපසු අයකර ගැනීමේ අනිකුත් ක්‍රම භාවිතා කිරීමෙන් නියමිත බැංකු වලකා නැති බව.*

**34.** නියමිත බැංකුවකට අය විය යුතු මුදල වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල ව එම බැංකුව විසින් ආපසු අය කර ගැනීම, 32 වන වගන්තියේ කිසිවකින් වැළැක්වෙතැයි නොසැලකිය යුතුය.

*ණය සහනදායක ආඥාපනත සහ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත නියමිත බැංකුවකට අයවිය යුතු ණයවලට අදාළ නොවන බව.*

**35.** ණය සහනදායක ආඥාපනතේ හෝ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ කිසිවක් යම් නියමිත බැංකුවකට අයවිය යුතු ණයකට අදාළ නොවන අතර ඒ කිසිවක් ඒ ණයකට අදාළ වන ලෙස හෝ ඒ ණය ආපසු අය කර ගැනීම සම්බන්ධයෙන් යම් නියමිත බැංකුවකට ඇති අයිතිවාසිකම්වලට ඉන් හානියක් වන ලෙස හෝ ඒ අයිතිවාසිකම් කෙරෙහි එය බලපාන ලෙස හෝ සලකනු නොලැබිය යුතුය.

## III වන කොටස

### ගොවි කාරක සභා

*අමාත්‍යවරයා විසින් නිශ්චය කරන ලද එක් එක් ප්‍රදේශය සඳහා ගොවි කාරක සභා.*

**36.** (1) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන එක් එක් ප්‍රදේශය සඳහා, ඒ ප්‍රදේශය තුළ පිහිටි කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ ගොවි කාරක සභාවක් පිහිටුවනු ලැබේ.

(2) ඒ එක් එක් කාරක සභාව අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඊට අමාත්‍යවරයා විසින් පවරනු ලබන නාමින් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධ ව නඩු පවරනු ලැබීම ද කළ හැකිය.

(3) ඒ එක් එක් කාරක සභාවේ සාමාජිකයන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර ඒ එක් එක් කාරක සභාව කෘෂිකර්මයේ ව්‍යාවෘත තැනැත්තන්ගේ සම්බන්ධතා නියෝජනය කිරීමට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් හෝ පත් කරනු ලැබිය යුතු යයි අමාත්‍යවරයාට හැඟෙන වෙනත් තැනැත්තන් දස දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වන්නේ ය.

(4) ඒ කාරක සභාවේ සාමාජිකයන් අතුරින් එක් තැනැත්තකු කාරක සභාවේ සභාපති ලෙස ද තවත් තැනැත්තකු කාරක සභාවේ උපසභාපති ලෙස ද අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතුය.

(5) ඒ කාරක සභාවේ කවර හෝ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් වන නමුත්—

(අ) නියමිත කාලය ගත වීම නිසා තම ධුරය දැරීම අවසන් කරන සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුසු වන්නේය ;

(ආ) කාරක සභාවේ යම් සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(6) තමා පැමිණ සිටින කාරක සභාවේ සෑම රැස්වීමක දී ම සභාපති මූලාසනය දැරිය යුතුය. සභාපති නොපැමිණ සිටි විට ඒ කාරක සභාවේ උපසභාපති මූලාසනය දැරිය යුතුය.

(7) අසනීප වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා තම ධුරයේ යුතුකම් ඉටුකිරීමට සාමාජිකයකු තාවකාලික ව අපොහොසත් වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කළ හැකිය.

(8) කාරක සභාවේ යම් සාමාජිකයකු මානසික හෝ ශාරීරික අබලතාවක් නිසා තම ධුරයේ යුතුකම් ඉටු කිරීමට නොහැකි තත්ත්වයක හෝ වෙනත් හේතුන් නිසා ඒ යුතුකම් ඉටු කිරීමට නුසුදුසු තත්ත්වයක සිටින බව අමාත්‍යවරයාට ඒත්තු ගියහොත් එම සාමාජිකයාගේ පත්වීම අවසාන කොට වෙනත් සාමාජිකයකු ඒ කාරක සභාවට පත් කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකිය :

එසේ වුව ද ධුරයෙන් ඉවත් කරනු ලබන හෝ අන් ලෙසකින් ධුරය අත්හරින සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු, ඔහු කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ධුරය අත්හැරිය හොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කොටස තුළ, ධුරය දැරිය යුතුය.

(9) ගොවි කාරක සභාවක බලතල පාවිච්චි කිරීම සඳහා සහ යුතුකම් ඉටු කිරීම සඳහා ඒ සභාව විසින් සුදුසු යයි සලකනු ලබන සේවකයන් හෝ නියෝජිතයන් ගොවි කාරක සභාව විසින් පත් කළ හැකිය.

(10) මේ පනතේ අන් විධිවිධානවලට යටත් ව, ගණපූරණය සඳහා අවශ්‍ය ගණන නිශ්චය කිරීමේ බලය ඇතුළු ව කාරක සභාවේ කාර්ය පරිපාටිය නියම කිරීමේ හා විධිමත් කිරීමේ බලය ගොවි කාරක සභාවකට ඇත්තේ ය.

(11) ගොවි කාරක සභාවක කිසි ම ක්‍රියාවක් හෝ ක්‍රියා පරිපාටියක්, එම සභාවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් පමණක් ම අවලංගු නොවන්නේ ය.

ගොවි කාරක සභාව කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවල පාලනයට යටත් බව.

37. (1) මේ පනතින් හෝ වෙනත් යම් නීතියකින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගයකින් පැවරුණු කාර්යයන් හෝ බලතල ක්‍රියාවේ යෙදීමේ දී සෑම ගොවි කාරක සභාවක් ම, එම සභාව ඇත්තේ යම් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක බල ප්‍රදේශය තුළ ද ඒ කමිටුවේ පාලනයට හා විධානයට යටත් විය යුතුය.

(2) මේ පනතින් හෝ එය යටතේ ගොවි කාරක සභාවක් වෙත පැවරුණු, නියමවුණු හෝ වෙන් කරනු ලැබූ යම් බලයක්, යුතුකමක් හෝ කාර්යයක්, ක්‍රියාත්මක කරන ලෙස, ඉටු කරන ලෙස හෝ කරන ලෙස, යම් ගොවි කාරක සභාවක් ඇත්තේ කවර කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක බල ප්‍රදේශය තුළ ද ඒ කමිටුව විසින් විධාන කරනු ලැබ, එසේ ඒ විධානයේ නිශ්චිත ව සඳහන් කාලය ඇතුළත එසේ කිරීම ඒ ගොවි කාරක සභාව විසින් පැහැර හැරි අවස්ථාවක, කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් ඒ බලය, යුතුකම හෝ කාර්යය ක්‍රියාත්මක කළ හැකි, ඉටු කළ හැකි හෝ කළ හැකි අතර මේ වගන්තියේ විධිවිධාන අනු ව කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් විසින් කරනු ලැබූ යම් ක්‍රියාවක් ඒ ගොවි කාරක සභාව විසින් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතුය.

ගොවි කාරක සභාව කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවල අනුයෝජිතයා වශයෙන් කටයුතු කළ යුතු බව.

38. යම් ප්‍රදේශයක පිහිටුවනු ලැබූ ගොවි කාරක සභාවක්, ඒ ගොවි කාරක සභාව ඇත්තේ යම් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක බල ප්‍රදේශය තුළ ද ඒ කමිටුව විසින් කලින් කල ඒ සභාවට පවරනු ලබන යම් කාර්යයන් හා යුතුකම් හා වෙනත් යම් නීතියක් යටතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් යටතේ ඒ සභාවට පවරනු ලබන වෙනත් කාර්යයන් හා යුතුකම් තම බල ප්‍රදේශය තුළ ඉටු කළ යුතුය.

කෘෂිකාර්මික ඉඩම් ලේඛනය.

39. (1) පලදා වර්ධන කමිටුවේ ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ ලේඛනයක් පිළියෙළ කොට පවත්වා ගෙන යාමට සෑම ගොවි කාරක සභාවක් විසින් ම පලදා වර්ධන කමිටුවට ආධාර කළ යුතුය. ඒ කෘෂිකාර්මික ඉඩම් ලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි කෘෂිකාර්මික ඉඩම්, ඒ එක් එක් කෘෂිකාර්මික ඉඩමේ ඉඩම් හිමියාගේ, ඉඩම් හිමි ගොවියාගේ, අඳ ගොවියාගේ සහ සාමූහික ගොවියාගේ නම ද ඒ ලේඛනයේ ඇතුළත් විය යුතු යයි කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් නියම කරනු ලබන අනිකුත් විස්තර ද සඳහන් කරනු ලැබිය යුතු අතර ඒ ලේඛනය ගොවි කාරක සභාව විසින් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ අධීක්ෂණය යටතේ වර්ෂයක් පාසා ප්‍රතිශෝධනය කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිළියෙළ කරන ලද හෝ ප්‍රතිශෝධනය කරන ලද සහ තත්කාලයෙහි වලංගු ව පවත්නා ලේඛනයක යම් සටහනක් ඒ සටහනෙහි ඇතුළත් විස්තර සම්බන්ධයෙන් මුල් බැල්මට පිළිගත හැකි සාක්ෂියක් වන්නේ ය.

(3) පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය :—

(අ) (1) වන උපවගන්තියෙහි සඳහන් ලේඛන පිළියෙළ කිරීමෙහි හා ප්‍රතිශෝධනය කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය ;

(ආ) එවැනි ලේඛනයක තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට මේ පනත යටතේ හිමිකම් ඇතැයි කියන්නා වූ ද තමාගේ නම එසේ ඇතුළත් කර නොමැත්තා වූ ද යම් තැනැත්තකුට සිය නම එහි ඇතුළත් කරවා ගැනීම සඳහා කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව වෙත ඉල්ලුම් කිරීමට විධිවිධාන සැලැස්වීම ;

(ඇ) එවැනි යම් ලේඛනයක තමාගේ නම ඇතුළත් වී ඇත්තා වූ ද වෙනත් යම් තැනැත්තකුගේ නම එහි ඇතුළත් වී තිබීමට විරුද්ධත්වය දක්වන්නා වූ ද යම් තැනැත්තකු විසින් ඒ වෙනත් තැනැත්තාගේ නම නාම ලේඛනයෙන් මකා හරින ලෙස කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව වෙත ඉල්ලුම් කිරීමට විධිවිධාන සැලැස්වීම ; සහ

(ඈ) ඉල්ලීම් සහ විරුද්ධතාවන් නිශ්චය කිරීමෙහි ලා කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය.

ගොවි කාරක සභාවල යුතුකම්.

40. (1) යම් ප්‍රදේශයක් සඳහා පිහිටුවන ලද සෑම ගොවි කාරක සභාවක් ම—

(අ) යම් නියමිත බැංකුවක ගිණුමක් විවෘත කොට ඒ කාරක සභාවේ මුදල් සියල්ල ම හෝ යම් මුදලක් ඒ ගිණුමේ බැරට තැන්පත් කළ යුතුය ;

(ආ) ඒ ගොවි කාරක සභාව ඇත්තේ යම් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක බල ප්‍රදේශය තුළ ද ඒ කමිටුව වෙනුවෙන් සහ වෙනත් යම් ලිඛිත නීතියක් ක්‍රියාවෙහි යොදවන බලධරයන් වෙනුවෙන්, නියම කරනු ලැබිය හැකි නියමයන් හා කොන්දේසි මත, යම් තැනැත්තකුගෙන්, අවස්ථාවෝචිත පරිදි, ඒ පලදා වර්ධන කමිටුවට හෝ බලධරයාට අය විය යුතු මුදලක් හෝ දෙයක් ලබාගත යුතුය ;

(ඇ) නියම කරනු ලැබිය හැකි කාර්යයන් සඳහා තම බලතල සහ යුතුකම් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී සිදුවන වියදම් පියවීම සඳහා එම ගොවි කාරක සභාවේ මුදල් ප්‍රයෝජනයට ගත යුතුය ;

(ඈ) ඒ ගොවි කාරක සභාවේ ප්‍රාදේශීය බල සීමාව ඇතුළත සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් පිහිටි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක ගොවියා වෙත හෝ එහි ඉඩම් හිමියා වෙත නියමිත ප්‍රමාණයක් අනු ව වූ ගාස්තුවක් පනවා එය ඒ ගොවියාගෙන් හෝ ඉඩම් හිමියාගෙන් අයකර ගත යුතුය.

(2) සෑම ගොවි කාරක සභාවක් විසින් ම ඒ කාරක සභාවේ යම් සාමාජිකයකුට, නිලධරයකුට, සේවකයකුට හෝ නියෝජිතයකුට (1) වන උපවගන්තිය යටතේ ඒ කාරක සභාවේ කටයුතු හෝ බලතල යමක් පවරා දිය හැකිය.

*ගොවි කාරක සභාවල වැඩිදුර බලතල හා යුතුකම්.*

41. මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් වැඩිදුර බලතල හා යුතුකම් ගොවි කාරක සභා වෙත පවරනු ලැබිය හැකිය.

*ණය ගැනීමේ බලය.*

42. (1) ගොවි කාරක සභාවක් විසින්, මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව, අමාත්‍යවරයාගේ අනුමතියට යටත් ව ඒ කාරක සභාවේ යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණ ආණ්ඩුවෙන් හෝ යම් තැනැත්තකුගෙන් හෝ තැනැත්තන්ගෙන් හෝ ණයට ලබා ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) එවැනි කාරක සභාවක් විසින් ගනු ලබන සෑම ණයක් ම අමාත්‍යවරයා අනුමත කරන පොලී ප්‍රමාණයකට හෝ පොලී ප්‍රමාණ වලට ද ඒ ණය ආපසු ගෙවීම සඳහා ඔහු අනුමත කරන කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

*මුද්දර ගාස්තුවලින් සහ වෙනත් ගාස්තුවලින් ගොවි කාරක සභාව නිදහස් බව.*

43. සෑම ගොවි කාරක සභාවක් ම,—

(අ) එම ගොවි කාරක සභාව විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි වාසියට හෝ ලියා අත්සන් කරනු ලබන යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් හෝ අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුව මේ උපවගන්තිය යටතේ දෙන ලද නිදහස නිසා නොවේ නම් ගෙවීමට ඒ ගොවි කාරක සභාව යටත් වන අවස්ථාවක එකී ලේඛනය සම්බන්ධයෙන් අය විය යුතු ගාස්තුවෙන්, සහ

(ආ) ලේඛන ලියාපදිංචි කිරීමට අදාළ ව තත්කාලයෙහි බල පවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවකින්,

නිදහස් වන්නේ ය.

*ගොවි කාරක සභාව ආදායම් බද්දෙන් නිදහස් බව.*

44. සෑම ගොවි කාරක සභාවක් ම, එය විසින් ලබා ගන්නා ආදායම හෝ ලාභ විෂයෙහි යම් බද්දක් ගෙවීමෙන් නිදහස් වන්නේ ය.

*ගොවි කාරක සභාවක් විසුරුවා හැරීම.*

45. (1) ගොවි කාරක සභාවක් සම්බන්ධයෙන්—

(අ) මේ පනතින් පැවරුණු යුතුකම් ඕනෑකමින් ම පැහැර හැරීම හෝ ඒවා ඉටු කිරීමෙහි ලා විෂමාචාරය, හෝ

(ආ) ඒ ගොවි කාරක සභාව ඇත්තේ යම් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක බල ප්‍රදේශය තුළ හෝ ආධිපත්‍යය යටතේ ද ඒ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ විධාන වලට, උපදෙස්වලට හෝ නිර්දේශවලට නොනවත්වා ම අකීකරු වීම හෝ ඒ පිළිබඳ ව නොසැලකිලිමත් වීම හෝ

(ඇ) අදක්ෂතාවය හෝ නොමනා පාලනය, හෝ

(ඈ) මේ පනතින් පැවරුණු බලතල අනිසි ලෙස පාවිච්චි කිරීම

ඔප්පු කෙරෙන ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට යම් අවස්ථාවක අමාත්‍යවරයා සෑහීමට පත් වුවහොත් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඔහු විසින් ඒ ගොවි කාරක සභාවේ සාමාජිකයන් සියලු දෙනා ම හෝ ඉන් යම්කු ධුරයෙන් පහ කළ හැකිය.

(2) යම් ප්‍රදේශයක් සඳහා වූ ගොවි කාරක සභාවක් ක්‍රියාත්මක වීම අවසාන වූ අවස්ථාවක, මේ පනතේ විධිවිධාන යටතේ ඒ ප්‍රදේශය වෙනුවෙන් අලුත් කාරක සභාවක් සංස්ථාපනය කරනු ලබන තුරු, මේ පනත යටතේ ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් ගොවි කාරක සභාවක හිමිකම්, බලතල, වරප්‍රසාද, වගකීම්, යුතුකම් සහ කාර්යයන් සියල්ලක් ම හෝ ඉන් කිසිවක් අමාත්‍යවරයා හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරනු ලබන යම් නිලධරයකු විසින් ක්‍රියාවේ යෙදවිය හැකිය ; ඉටු කළ හැකිය ; නැතහොත් කළ හැකිය.

ගිණුම්.

46. අමාත්‍යවරයා විසින් කලින් කල විධාන කරනු ලබන ආකාර යකින් සහ ක්‍රමයකින් ගොවි කාරක සභාවේ ගිණුම් පවත්වාගෙන යාම එක් එක් ගොවි කාරක සභාවේ සභාපතිගේ යුතුකම වන්නේය. ඒ ගිණුම් විගණනය සඳහා අමාත්‍යවරයා විසින් කරනු ලබන යම් විධානයකට අනු ව ඒ ගිණුම් වාර්ෂික ව විගණනය කරනු ලැබිය යුතු අතර ඒ විගණනයෙන් පසු හැකි තාක් ඉක්මණින් ඒ ගිණුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

## IV වන කොටස

## පොදු විධිවිධාන

ඉඩමක් කුඹුරක්ද නැද්ද යන ආරාවුල කෘෂිකාර්මික විනිශ්චය අධිකාරය විසින් තීරණය කළ යුතු බව.

47. (1) යම් ඉඩමක් මේ පනතේ අර්ථානුකූල ව කුඹුරක්දැයි ආරාවුලක් පවත්නා විට, එම ඉඩම කුඹුරක්ද නැද්ද යන්න කෘෂිකාර්මික විනිශ්චය අධිකාරය විසින් තීරණය කළ යුතු අතර ඒ තීරණය ආරාවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන්ට ලියවිල්ලකින් දන්වා යැවිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද තීරණයෙන් ආරාවුලට සම්බන්ධ පාර්ශ්වකරුවන් අතෘප්තියට පත් වූ අවස්ථාවක ඒ තීරණය ඒ පාර්ශ්වකරුවන්ට දන්වා යැවීමෙන් දවස් තිහක් ඇතුළත, ඔවුන් විසින් නීති ප්‍රශ්නයක් මත ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කළ හැකිය.

(3) (2) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලබන තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන අතර එය කිසි ම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

කෘෂිකාර්මික ඉඩම් අනිවාර්යයෙන් අත් කර ගැනීම.

48. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් එම නිවේදනයෙහි සඳහන් කෘෂිකාර්මික ඉඩම මේ පනතේ කාර්යවලින් යම් කාර්යයක් සඳහා හෝ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් සඳහා අත් කර ගැනීම අවශ්‍ය යයි අමාත්‍යවරයා සහතික කළ විට, එම ඉඩම, ඉඩම් අත් කර ගැනීමේ පනතේ කාර්යයන් සඳහා, මහජන කාර්යයකට අවශ්‍ය වූවක් ලෙස සලකා එය ඒ පනත යටතේ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් සඳහා අත් කර ගනු ලැබ එම කමිටුව වෙත පවරනු ලැබිය හැකිය :

එසේ වුව ද ඒ පනතේ පටහැනි ව කුමක් සඳහන් ව ඇත ද ඒ පනත යටතේ ඒ ඉඩම අත් කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනතේ විධිවිධානවලට අනුකූල ව විය යුතුය.

*නියමිත හේතුවක් මත රජයට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලද කුඹුරක් අත් කර ගැනීම.*

49. (1) අයිතිකරු විසින් යම් නියමිත හේතුවක් මත රජයට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලද යම් කුඹුරක්, රජය විසින් මේ වගන්තියේ මින්මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි ලබා ගැනීම හා විකිණීම කළ හැකිය. මේ උපවගන්තිය යටතේ විකිණීම සඳහා ඉදිරිපත් කිරීමක්, ඉදිරිපත් කිරීමේ හේතුව නිශ්චය කෙරෙන ලියවිල්ලකින් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව වෙත කළ යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කිරීමක් කළ විට, ඒ ඉදිරිපත් කිරීම කර ඇත්තේ යම් නියමිත හේතුවක් මත ද නැද්ද යන්න කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් තීරණය කර, එම තීරණය, ඉදිරිපත් කිරීම කළ තැනැත්තා වෙත ලියවිල්ලකින් දන්වා යැවිය යුතුය. ඒ තැනැත්තා එම තීරණයෙන් අතෘප්තියට පත් වූ විටෙක ඒ තීරණය ඔහුට දන්වා යවා දින තිහක් ඇතුළත ඒ තීරණයට විරුද්ධ ව කෘෂිකාර්මික විනිශ්චය අධිකාරය වෙත ලියවිල්ලකින් අභියාචනා කළ හැකිය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ඉදිරිපත් කිරීමක් යම් නියමිත හේතුවක් මත කරන ලද්දක් බව කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව හෝ විනිශ්චය අධිකාරය විසින් නිශ්චය කළ විට ඒ ඉදිරිපත් කිරීමට සම්බන්ධ කුඹුර රජය විසින් ලබා ගැනීම අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයකින් සහතික කළ යුතුය. ඒ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ වූ විට ඉඩම් අත් කර ගැනීමේ පනත අදාළ වීමේ කාර්යය පිණිස ඒ කුඹුර මහජන කාර්යයක් සඳහා අවශ්‍ය වූ එකක් ලෙස සැලකිය යුතු අතර ඒ පනත යටතේ අත් කරගත හැකිය :

එසේ වුව ද ඉහත සඳහන් පනතෙහි පටහැනි ව කුමක් සඳහන් වුව ද ඒ පනත යටතේ ඒ කුඹුර අත් කර ගැනීම සඳහා ගෙවන වන්දි ප්‍රමාණය, මේ පනත නො පනවන ලද කලෙක් හි මෙන්, ඒ කුඹුරෙහි වාර්ෂික බද්දෙහි වටිනාකම ගණන් බලා දහයෙන් වැඩි කළ විට ලැබෙන ගුණිතයට සමාන විය යුතු අතර නියමිත ආකාරයට ද විය යුතුය.

(4) මේ වගන්තියේ විධිවිධාන සලස්වා තිබෙන ආකාරයෙන් රජය විසින් අත් කර ගන්නා ලද කුඹුරක් ඒ කුඹුර සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් පිහිටි ප්‍රදේශයේ බලය දරන කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව සතු කර දිය යුතුය. ඒ කමිටුව විසින්,—

(අ) රජය විසින් ලබා ගන්නා ලද කාලයෙහි ඒ කුඹුරෙහි අඳ ගොවියකු වී නම්, ඔහුට එලෙස ම අඳ ගොවියා වශයෙන් සිටීමට අවසර දිය යුතුය ; තවද

(ආ) ඒ කුඹුරෙහි අඳ ගොවියකු නො වී නම්, එහි අඳ ගොවියා වීමට සුදුසු තැනැත්තකු පත් කළ යුතුය ; ඔහු ඒ කාරක සභාවේ බල ප්‍රදේශය තුළ සිටින්නකු නම් වඩා සුදුසුය.

*කුඹුරක් කවර කාර්යයක් සඳහා යෙදිය හැකිද යන වග.*

50. (1) කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ ලිඛිත අවසරය නොමැති ව, (2) වන උපවගන්තියෙහි විධිවිධාන අනු ව වූ වගා කිරීමක් නොවන යම් කාර්යයක් සඳහා කිසි ම තැනැත්තකු විසින් කුඹුරු ප්‍රමාණයක් නො යෙදිය යුතුය.

(2) යම් කුඹුරු ප්‍රමාණයක—

(අ) වී, හෝ

(ආ) වී ගොවිතැන් කරන කන්න අතර තුර යම් කාලයක, වී හැර සෙසු බෝග හෝ සත්වාගාර, හෝ

(ඇ) කුඹුරු ප්‍රමාණයේ ගොවියා විසින් ඒ සඳහා ඉදිරිපත් කළ ලිඛිත ඉල්ලීමක් පිට කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් ස්වකීය අභිමතය පරිදි නිකුත් කරන ලද අවසර පත්‍රයකින් ඒ ප්‍රමාණයෙහි වගා කිරීමට බලය දී ඇති යම් බෝගයක් වේනොත් ඒ බෝගය,

වගා කළ හැකිය.

(3) යම් කුඹුරු ප්‍රමාණයක්—

(අ) (1) වන උපවගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කොට, යම් තැනැත්තකු විසින් යොදනහොත්, හෝ

(ආ) (2) වන උපවගන්තියෙහි විධිවිධාන අනු ව නොව, අන් ලෙස කින් ඒ කුඹුරු ප්‍රමාණයෙහි ගොවියා විසින් වගා කරනහොත්

අවස්ථාවෝචිත විය හැකි පරිදි ඒ තැනැත්තා නැතහොත් ඒ ගොවියා වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්සියයකට නො වැඩි දඩයකට සහ දඩය ගෙවීම පැහැර හැරියහොත් මසකට නො වැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් වන්නේය.

(4) මේ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධ ව යම් නඩු පැවරීමක දී වරදට විෂය වූ ක්‍රියාව කිරීමට කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ අවසරය තමා විසින් ලැබ සිටි බව ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා සතු වන්නේය.

වැරදි.

51. (අ) මේ පනත යටතේ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් විසින් කරන ලද යම් විධානයක් හෝ නියමයක් අනු ව හෝ එවැනි විධානයක් හෝ නියමයක් කිරීමට මේ පනත යටතේ බලය ලත් යම් තැනැත්තකු විසින් කරන ලද විධානයක් හෝ නියමයක් අනු ව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

(ආ) තම දැනීමේ හැටියට අසත්‍ය හෝ වැරදි විස්තර කිසිවක් ඇතුළත් යම් වාර්තාවක් හෝ ලිඛිත තොරතුරක් මේ පනතේ කාර්යයන් සඳහා සපයන ; හෝ

(ඇ) අන් කිසි තැනැත්තකුට මේ පනතින් හෝ මේ පනත යටතේ නියම කරනු ලැබූ හෝ බලය පවරනු ලැබූ යම් යුතුකමක් හෝ බලයක් ඔහු විසින් ඉටු කිරීමේ දී හෝ ක්‍රියාවෙහි යෙදීමේ දී ඒ අන් තැනැත්තාහට අවහිර කරන හෝ විරෝධය දක්වන,

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්සියයකට නො වැඩි දඩයකට හෝ මාස තුනකට නො වැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමකට ඔහු යටත් වන්නේය.

**52.** (1) මේ පනතේ විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය. නියෝග.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තිය මගින් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැති ව, නියම කරනු ලැබීමට මේ පනතේ සඳහන් හෝ නියමිත සියලු කරුණු සම්බන්ධයෙන් හා නියෝග සාදනු ලැබීමට මේ පනතින් නියමිත සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහි ලා නිශ්චිත ව සඳහන් කරනු ලබන පසු ව එළඹෙන දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එසේ අනුමත නොකරනු ලබන සෑම නියෝගයක් ම ඒ අනනුමතියේ දින සිට, එහෙත් එය යටතේ ඊට කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතුය. යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.

**53.** (1) කලින් කල සංශෝධනය කරන ලද 1958 අංක 1 දරන කුඹුරු පනත මෙයින් ඉවත් කරනු ලැබේ. 1958 අංක 1 දරන කුඹුරු පනත ඉවත් කිරීම.

(2) 1958 අංක 1 දරන කුඹුරු පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද කුඹුරු අරමුදලේ බැරට ඇති සියලු ම මුදල් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද කෘෂිකාර්මික පලදා වර්ධන අරමුදලට මාරු කළ යුතුය.

(3) කුඹුරු පනත යටතේ පිහිටුවන ලද ගොවි කාරක සභාවන්හි වත්කම් හා බැදීම් මේ පනත යටතේ පිහිටුවනු ලබන ගොවි කාරක සභාවලට මාරු කළ යුතුය.

(4) 1958 අංක 1 දරන කුඹුරු පනත ඉවත් කරනු ලැබුව ද—

(අ) කුඹුරු පනතේ විධිවිධාන යටතේ පිහිටුවා ඇති ගොවි කාරක සභා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට මෙ පනත යටතේ ගොවි කාරක සභා සංස්ථාපනය කරන තුරු තවදුරටත් කටයුතු කළ යුතුය ;

(ආ) ගොවිජන සේවා කොමසාරිස්වරයා ඉදිරියේ හෝ සමීක්ෂණ මණ්ඩලය ඉදිරියේ ඇති, කටයුතු අවසන් කිරීමට ඇත්තා වූ ද ඒ සම්බන්ධයෙන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත්තා වූ ද සියලු නීතිකෘත්‍ය, කුඹුරු පනත ඉවත් කර නොමැත්තාක් සේ සලකා ඒ කොමසාරිස්වරයා විසින් හෝ සමීක්ෂණ මණ්ඩලය විසින් හෝ විභාග කොට අවසන් කළ යුතුය ;

(ඇ) ගොවිජන සේවා කොමසාරිස්වරයා ඉදිරියේ සහ සමීක්ෂණ මණ්ඩලය ඉදිරියේ ආරම්භකර අවසන් කර ඇති, එහෙත් ඒ සම්බන්ධයෙන් කුඹුරු පනතේ 21 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ කටයුතු ආරම්භ කර නොමැති සියලු නීතිකෘත්‍ය පිළිබඳ ඉදිරි කට යුතු මේ පනතේ විධිවිධාන යටතේ කරගෙන යා යුතුය ;

(ඈ) කටයුතු අවසන් කිරීමට ඇති එහෙත් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙර ගොවිජන සේවා කොමසාරිස්වරයා හෝ සමීක්ෂණ මණ්ඩලය හෝ ඉදිරියේ ඒ සම්බන්ධ යෙන් පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොමැති සියලු නීති කෘත්‍ය මේ පනතේ විධිවිධාන යටතේ විභාග කොට අවසන් කළ යුතුය ;

(ඉ) කුඹුරු පනත යටතේ සාදන ලදු ව මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේදී බලපැවැත් වූ සියලුම නියෝග මේ පනත යටතේ සාදන ලද නියෝග ලෙස සැලකිය යුතු අතර ඒ අනු ව ඒවා මේ පනත යටතේ සාදන නියෝග මගින් සංශෝධනය කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකිය.

අර්ථ නිරූපණය.

54. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවුවහොත් මිස, මේ පනතෙහි—

"අස්කිරීම" යන්නෙන්, අඳ ගොවියකු සම්බන්ධයෙන් වූ විට අඳ ගොවියාට බදු දී ඇති කුඹුරු ප්‍රමාණයෙහි යම් කොටසක් හෝ එය සම්පූර්ණයෙන් ම හෝ ඔහු විසින් පාවිච්චි කිරීමේ, භුක්ති විඳීමේ හා වගා කිරීමේ අයිතිය නියම හෝ අනියම් ක්‍රමවලින් ඔහුට අහිමි කිරීම අදහස් වේ ;

"ඉඩම් හිමි ගොවියා" යන්න යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධ යෙන් වූ විට එම කුඹුරු ප්‍රමාණය සම්පූර්ණයෙන් ම වගා කරන්නා වූ එහි අයිතිකරුවකු හෝ එහි පොලීමරු උගස් හිමියා අදහස් වන අතර ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ පවරා දෙන ලද කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් නම්, ඒ ආඥාපනතෙන් හෝ එය යටතේ ඒ කුඹුරු ප්‍රමාණයට හිමිකම් ලබන්නා වූ තැනැත්තා ඒ කුඹුරු ප්‍රමාණයේ ඉඩම්හිමි ගොවියා ලෙස සැලකිය යුතුය ;

"ඉඩම් හිමියා" යන්න යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වූ විට එම ඉඩම් යම් තැනැත්තකුට බදු දෙන ලද නම්, එම බදු මුදලට එවකට හිමිකම් කියන ඉඩම් හිමි ගොවියා නොවන තැනැත්තා එයින් අදහස් වන අතර එම කුඹුරු ප්‍රමාණය බදු දෙන අඳ ගොවියා ද ඊට ඇතුළත් වේ;

"කෘෂිකර්මය" යන්නට—

(i) වී, කෙත් බෝග, කුළු බඩු, කාර්මික බෝග, එළවළු, පලතුරු, මල්, තණබිම් සහ සත්වාහාර වගා කිරීම :

(ii) කිරි පට්ටි පාලනය, සතුන් ඇති කිරීම සහ බෝ කිරීම; සහ

(iii) ශාක සහ එළ වතාන්,

ඇතුළත් වේ ;

"කෘෂිකාර්මික ඉඩම" යන්නෙන් මේ පනතේ අර්ථානුකූල ව කෘෂිකර්මය සඳහා ප්‍රයෝජනයට ගනු ලබන හෝ ප්‍රයෝජනයට ගත හැකි ඉඩම් අදහස් වන අතර, පෞද්ගලික ඉඩම් සහ ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙන යම් ප්‍රඥප්තියක් යටතේ අන් සතු කරනු ලැබූ ඉඩම් ඊට ඇතුළත් වේ ;

"කෘෂිකාර්මික පලදා වර්ධන අරමුදල" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනත යටතේ පිහිටුවන ලද කෘෂිකාර්මික පලදා වර්ධන අරමුදල අදහස් වේ;

"කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනත යටතේ පිහිටුවන ලද කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව අදහස් වේ;

"කෘෂිකාර්මික විනිශ්චය අධිකාරය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනත යටතේ පිහිටුවන ලද කෘෂිකාර්මික විනිශ්චය අධිකාරය අදහස් වේ;

"කුඹුර" යන්නෙන් වී ගොවිතැන් කරන හෝ වී ගොවිතැන සඳහා පිළියෙළ කළ හෝ මීට කලින් කවර දිනක හෝ වී ගොවිතැන් කරන ලදු ව වී ගොවිතැන සඳහා සුදුසු වන ඉඩමක් අදහස් වේ. ගොවියා විසින් කමත වශයෙන් හෝ පදිංචියට ගෙයක් ඉදි කර ගැනීම සඳහා හෝ යොදා ගන්නා, එම ඉඩමට යාබද හෝ ඊට සම්බන්ධ අනෙකුත් ඉඩම් ද ඊට ඇතුළත් වේ. එහෙත් ශේන් හෝ මේ පනතේ විධිවිධාන අනු ව වූ වගා කිරීමක් නො වන යම් කාර්යයක් සඳහා පලදා වර්ධන කමිටුවේ අවසරය ඇති ව, යොදනු ලබන යම් ඉඩමක් ඊට ඇතුළත් නොවේ;

"ගොවි කාරක සභාව" යන්නෙන් මේ පනතේ විධිවිධානවලට අනුකූල ව සංස්ථාපනය කරන ලද ගොවි කාරක සභාවක් අදහස් වේ;

"ගොවි කුලීකරු" යන්නෙන් මුදලින් හෝ ද්‍රව්‍යයෙන් ගෙවනු ලබන වේතන සඳහා, වී නිෂ්පාදනය සම්බන්ධ යම් වැඩක් කිරීමට හෝ මේ පනත යටතේ හෝ එය මගින් යම් කුඹුරු ප්‍රමාණයක වගා කිරීමට අවසර දුන් අන් කිසි වැවිල්ලක් ඒ කුඹුරු ප්‍රමාණය වගා කිරීම හා සම්බන්ධ යම් වැඩක් කිරීමට හෝ යොදා ගන්නා තැනැත්තෙක් අදහස් වේ ;

"ගොවියා" යන්නෙන් යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වූ විට තමන් විසින් ම හෝ තම පවුලේ යම් සාමාජිකයකු ලවා හෝ ගොවි කුලිකරුවකු නොවන වෙන යම් තැනැත්තකු සමඟ හවුලේ හෝ, ඒ කුඹුරු ප්‍රමාණයේ වී ගොවිතැන් කරන එක් එක් කන්නය තුළ—

(අ) සී සෑම, වැපිරීම හා ගොයම් කැපීම යන ක්‍රියාවලින් දෙකක් හෝ වැඩි ගණනක් හා

(ආ) වගාව රැකීමේ හෝ බලා ගැනීමේ ක්‍රියාව,

කරන තැනැත්තෙක් හෝ යම් තැනැත්තකු ලවා ඒ කටයුතු කරවන ගොවි කාරක සභාවක් අදහස් වේ;

"නියමිත බැංකුව" යන්නෙන් මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව හෝ යම් සමුපකාර ග්‍රාමීය බැංකුවක් අදහස් වේ;

"පවුලේ සාමාජිකයා" යන්නෙන් එය යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට, ඒ තැනැත්තාගේ කලත්‍රයා හෝ පුත්‍රයෙක් හෝ දියණියක් හෝ ඒ තැනැත්තාගේ මව්පියන් ගෙන් කෙනෙක්, සහෝදරයෙක් හෝ සහෝදරියක් හෝ ඒ තැනැත්තාගේ සහෝදරයකුගේ හෝ සහෝදරියකගේ දරුවෙක් අදහස් වේ;

"බදු දීම" යන්න යම් කුඹුරු ප්‍රමාණයක් සම්බන්ධයෙන් වූ විට යම් සේවයක් ඉටු කිරීම හෝ මුදලින් නැතහොත් එම කුඹුරු ප්‍රමාණයේ අස්වැන්නෙහි පංගුවකින් සමන්විත බද්දක් ගෙවීම සලකා වාචික හෝ ලිඛිත ගිවිසුමක් යටතේ එම කුඹුරු ප්‍රමාණය භුක්ති විඳීමට සහ වැඩ කිරීමට යම් තැනැත්තකුට අවසර දීම එයින් අදහස් වේ;

"සාම නිලධරයා" යන්නට පොලිස් නිලධරයකු සහ පොලිස් කාර්යයන් කිරීමට දිසාපති විසින් ලියවිල්ලකින් පත් කරනු ලැබූ ග්‍රාම සේවකයෙක් ඇතුළත් වේ;

"ශ්‍රී ලංකාවේ පුරවැසියා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හා සම්බන්ධ ව තත්කාලයේ බලපවත්නා යම් නීතියක් යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයෙක් අදහස් වේ.

## උපලේඛනය

(7 වන වගන්තිය)

1. පුත්‍රයෝ
2. දුහිතෘවරු
3. මුණුබුරෝ
4. මිණිබිරියෝ
5. පියා
6. මව
7. සහෝදරයෝ
8. සහෝදරියෝ
9. දෙමව්පියන්ගේ සහෝදරයෝ
10. දෙමව්පියන්ගේ සහෝදරියෝ
11. දෙමව්පියන්ගේ සහෝදර සහෝදරියන්ගේ පුත්‍රයෝ
12. දෙමව්පියන්ගේ සහෝදර සහෝදරියන්ගේ දුහිතෘවරු.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත් වල සහ නීති වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත, සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.